ඓකික නිබන්ධ අංක: 02

*Research Monograph No. 02*

# අ.පො.ස. උසස් පෙළ පන්තිවල සිසුන්ගේ දෛනික පාසල් පැමිණීම අවම වීම සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

# Students‘ Absenteeism to G.C.E. (Advanced Level) Classes and Proposed Solutions to be Taken


අධ්‍යාපන අමාත්‍යාංශය

දෙසැම්බර්, 2020

**Ministry of Education**

December, 2020

ඓකික නිබන්ධ අංකඃ 02

**Research Monograph No: 02**

# අ.පො.ස. උසස් පෙළ පන්තිවල සිසුන්ගේ දෛනික පාසල් පැමිණීම අවම වීම සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

# Students' Absenteeism to G.C.E. (Advanced Level) Classes and Proposed Solutions to be Taken

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

දෙසැම්බර්, 2020

**Research and Development Branch**
**Ministry of Education**

**December, 2020**

# පෙරවදන

දශකයකටත් පෙර සිට අධ්‍යාපන පද්ධතියේ ගැටලුවක් වීමේ පෙරනිමිති පෙන්නුම් කළ 13 ශ්‍රේණියේ සිසුන් පාසල් නොපැමිණීමේ ප්‍රවණතාව වර්තමානයේ දී බරපතළ ගැටලුවක් බවට පත්වී ඇත. මෙම ගැටලුවට කඩිනම් විසඳුම් සෙවීමේ ඇති වැදගත්කම හඳුනාගත් රාජ්‍ය ගිණුම් කාරක සභාව මෙම ගැටලුව හා සම්බන්ධ පර්යේෂණ අනාවරණ පිළිබඳව විමසීම් කර ඇති අතර මෙම පර්යේෂණ අධ්‍යයනයට හේතුකාරක වූයේ එම විමසුමයි.

අධ්‍යාපන පද්ධතිය තුළ මෙම ගැටලුව ආශ්‍රිත විවිධ පැතිකඩ අළලා ලියැවුණු පර්යේෂණ අධ්‍යයන රාශියක් හඳුනා ගත් පර්යේෂණ හා සංවර්ධන ශාඛාව, මෙම පර්යේෂණය සිදුකිරීම සඳහා පර්යේෂණ ආශ්‍රිත ලේඛන ක්‍රමයේ නවතම විකාශනයක් වන ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචන ක්‍රමවේදය භාවිත කිරීමට තීරණය කරන ලදි. එමගින්, ගැටලුව දෙස විවිධ දිශානතිවලින් විශ්ලේෂණය කරමින් වඩා සුදුසු විසඳුම් යෝජනා කරා යොමු වීමට අවස්ථාව සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

පර්යේෂණ රාශියක අනාවරණ එකතුවක් ලෙස ප්‍රකාශයට පත්වන මෙම පර්යේෂණ අධ්‍යයනයේ විසඳුම් යෝජනා 13 ශ්‍රේණියේ සිසුන් පාසල් නොපැමිණීමේ ගැටලුවට පිළියම් සෙවීමට බලධාරීන් විසින් භාවිත කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**ආචාර්ය මධූරා එම්. වේහැල්ල**
අතිරේක ලේකම් ( ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Foreword**

Since more than a period of decade, the tendency towards absenteeism to schools by students of grade 13 gave an inkling of converting it into a problem of the general education system. At present, the same has become a crucial issue to be resolved urgently. The Committee on Public Accounts (COPA) which has clearly recognized the critical status of this problem, has inquired about the research findings with regard to this issue and this research study was conducted consequently.

Thus, the Research and Development Branch identified a number of research studies conducted based on different angles of this problem prevailing in the education system and therefore, decided to conduct this study using Qualitative Systemic Review, a novel existence of documentary research method. Therefore, I firmly believe that it will open up new vistas to come up with more suitable resolutions to this issue by analyzing the problem in different perspectives.

I am of the view that the proposals and recommendations embedded in this study which comes into being as a collection of findings of number of research studies conducted earlier would be fully consumed by the relevant authorities to resolve the problem of non-attending to schools by G.C.E. (Advanced Level) students in grade 13.

**Dr. (Mrs.) Madhura M. Wehella**
Additional Secretary
(Policy, Planning & Performance Review)
Ministry of Education

**යොමු කිරීම**

**ආචාර්ය මධුරා. එම්. වෙහැල්ල මිය**
අතිරේක ලේකම්, (ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Direction**

**Dr. (Mrs.) Madhura M. Wehella**
Additional Secretary, (Policy, Planning & Performance Review)
Ministry of Education

**මග පෙන්වීම**

**එස්. කේ. ලීලාරත්න මිය**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Guidance**

**Mrs. S. K. Leelaratna**
Director of Education (Research & Development)
Ministry of Education

**අධ්‍යයන මග පෙන්වීම**

**විශ්‍රාමික මහාචාර්ය ජී. ඩී. ලේකම්ගේ මිය**
විවෘත විශ්වවිද්‍යාලය, නාවල

**ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු මහතා**
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**Academic Guidance**

**Retired Professor (Mrs) G. D. Lekamge**
Open University of Sri Lanka, Nawala

**Dr. Godwin Kodithuwakku**
Retired Deputy Director General
National Institute of Education

**පර්යේෂණ රචනය**

**සුමිත් පරාක්‍රමවංශ මහතා**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන)
කලාප අධ්‍යාපන කාර්යාලය, ඇල්පිටිය

**ඩී. එම්. වංශවතී මෙය**
පීඨාධිපති (විශ්‍රාමික),
පස්දුන්රට අධ්‍යාපන විද්‍යාපීඨය, කළුතර.

**ඒ. ආර්. එස්. පෙරේරා මිය**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Research Writing**

**Mr. Sumith Parakramawansa**
Deputy Director of Education (Administration)
Zonal Education Office, Elpitiya

**Ms. D. M. Wansawathie**

President (Retired)
Pasdunrata National College of Education, Kalutara

**Mrs. A. R. S. Perera**
Deputy Director of Education, (Research and Development Branch)
Ministry of Education

**පර්යේෂණ සහාය**

**දිල්රුක්ෂි පෙරේරා මිය**
සංවර්ධන නිලධාරී, (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**අනුරාධා නිර්මලී මිය**
සංවර්ධන නිලධාරී (පුහුණු), (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Research Assistance**

**Mrs Dilrukshi Perera**
Development Officer, (Research and Development Branch)
Ministry of Education

**Mrs Anuradha Nirmalie**
Development Officer (Trainee), (Research and Development Branch)
Ministry of Education

**පිටකවර නිර්මාණය**

**ඒ. ආර්. එස්. පෙරේරා මිය**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Cover Page Designing**

**Mrs. A. R. S. Perera**
Deputy Director of Education, (Research and Development Branch )
Ministry of Education

**අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම**

**බී. ජී. බුද්ධි හංසිකා මෙය**
පරිගණක පුහුණු, (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Type Setting & Page Designing**

**Ms. B. G. Buddhi Hansika**
Computer Trainee, (Research and Development Branch)
Ministry of Education

# විධායක සංක්ෂිප්තය

අධ්‍යාපනයේ අපේක්ෂිත පූර්ණ පෞරුෂයකින් හෙබි ඵලදායී පුරවැසියෙකු බිහි කිරීමෙහි ලා වගකීම විධිමත් ව ඉටු කිරීම හා සබැඳි ප්‍රමුඛතම ආයතනය පාසල වේ. පාසලින් ලබා දෙන අධ්‍යාපනය ඵලදායී කර ගැනීම සම්බන්ධ ප්‍රධාන සාධකයක් වනුයේ දෛනිකව පාසලට පැමිණ අධ්‍යයන කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම ය. මේ නිසා සිසුන් නිතිපතා පාසලට පැමිණීමේ අනුපාතිකය අධ්‍යාපන කාර්යසාධනයේ ඵලදායීතාව තක්සේරු කිරීමේ දර්ශකයක් ලෙස ද යොදා ගැනේ. ශ්‍රී ලංකාවේ රජයේ පාසල් පද්ධතියේ අනෙකුත් ශ්‍රේණිවලට සාපේක්ෂ ව උසස් පෙළ පන්තිවල දී ශිෂ්‍ය පාසල් පැමිණීම අවම මට්ටමක පැවතීම කැපී පෙනෙන ලක්ෂණයකි. උසස් පෙළ විභාගයට අයදුම් කරන අවස්ථාව දක්වා වූ පාසල් පැවැත්වූ දින ගණනින් 80%ක පැමිණීම සම්පූර්ණ කර තිබීම ද අත්‍යවශ්‍ය වේ. සිසුන්ගේ, ශිෂ්‍යන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි පාසල් නොපැමිණීම දැඩි සෘණාත්මක බලපෑමක් පවතින බව ද නිරීක්ෂණය වී ඇත. උසස් පෙළ සිසුන්ගේ දීර්ඝ කාලීන නොපැමිණීම අධ්‍යාපනයේ සියලු පාර්ශවකරුවන්ගේ වගකීම මෙන් ම වගවීම හා සබැඳි ගැටලු සහගත තත්වයකි. ඊට පාසල අභ්‍යන්තර මෙන්ම පාසලෙන් පරිබාහිර කරුණු ද බලපා ඇත. අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳ ගැටලුව අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සැලකීමේ දී භෞතික මෙන් ම මානව සම්පත් නාස්තියකි. ඒනම් පාසල් නොපැමිණෙන සිසුන් පිරිස සඳහා පාසල වෙන් කරන ලද භෞතික සම්පත් හා මානව සම්පත් අපතේ යාමක් වන අතර අධ්‍යාපන අරමුණු අර්ථාන්විත කර ගැනීමට බාධා පමුණුවන්නකි. උසස් පෙළ සිසුන් දීර්ඝ කාලීන ව පාසල් නොපැමිණීමේ ගැටලුව හුදකලා සංසිද්ධියක් නොවන අතර ඒය විසඳීම පිණිස උසස් පෙළ සිසුන් මුහුණ පා ඇති විවිධ ගැටලු සහ ඒවා විසඳීම පිණිස සිදු කර ඇති පර්යේෂණ අනාවරණ පදනම් කර ගෙන යෝජනාවලියක් ඉදිරිපත් කිරීම ව වැදගත් වේ.

සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ස්වභාවය, ඒම නොපැමිණීමේ ගැටලුව විසඳීමට ඉදිරිපත් ව ඇති නිර්දේශ සහ යෝජනා තුලනාත්මක ව අධ්‍යයනය කර සිසුන්ගේ පාසල් පැමිණීම වර්ධනය කිරීම සඳහා වන පර්යේෂණ අනාවරණ සහ නිර්දේශ අධ්‍යයනය කර ඒ සඳහා ගත යුතු පියවර ඉදිරිපත් කිරීම මෙම ලේඛන අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබුවේ ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචන (Qualitative systematic review) යි.

තව ද උසස් පෙළ පන්තිවල සිසුන්ගේ පාසල් නොපැමිණීම, උසස් පෙළ විෂය ආශ්‍රිත අධ්‍යයන සහ පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු වීම යන තේමා යටතේ සිදු කර ඇති අධ්‍යයන පහළොවක් පරිශීලනය කරන ලදී. විමර්ශනයට ලක් කරන ලද ලේඛන ආශ්‍රයෙන් ඉදිරිපත්ව ඇති අනාවරණ අ.පො.ස. (උ.පෙ.) සිසුන් පාසල් පැමිණීම අවම වීම හා සබැඳි අධ්‍යාපන ප්‍රතිපත්තිමය දුර්වලතා, සිසුන් පාසල් පැමිණීම අවම වීමට බලපානු ලබන පාසල් කළමණාකරණය සහ පරිපාලනමය අඩුපාඩු, විෂයමාලාව සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා, අධ්‍යාපනය, පාසල හා සබැඳි දෙමාපිය සහ ශිෂ්‍ය අපේක්ෂණ සහ පෞද්ගලික උපකාරක පන්තිවල බලපෑම යන කරුණු යටතේ විශ්ලේෂණය කරන ලදී.

උසස් පෙළ සිසුන්ගේ පැමිණීම වර්ධනය කිරීම සම්බන්ධ ව ඉදිරිපත් ඇති නිර්දේශ සහ යෝජනා යටතේ, ප්‍රතිපත්තිමය තීරණ, පෞද්ගලික උපකාරක පන්ති නියාමන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, අ.පො.ස. (උ.පෙ.) විභාගය නව තක්සේරු සංස්කෘතියට අනුගත කිරීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, පාසල් මට්ටමේ කළමණාකරණය හා පරිපාලනය සහ පාසල් උපදේශන සහ වෘත්තීය මාර්ගෝපදේශන සේවාව යන ශීර්ෂ ඔස්සේ විශ්ලේෂණය කොට පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

1. අ.පො.ස. (උ.පෙ.) විභාගයේ ඇති දැඩි තරඟකාරී බව, උසස් අධ්‍යාපනය හා සෘජු ව සම්බන්ධ වන බැවින් **උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම** සහ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට සමානුරූපී වන සේ **අ.පො.ස. උසස් පෙළ පාඨමාලා යළි සමාලෝචනය කිරීම**

2. අධ්‍යාපනයේ විවිධ **පාර්ශවකරුවන්ගේ වගකීම් නීතිමය පද්ධතියක් ස්ථාපිත කිරීම** සහ ගුරු හිඟය, පාසල් නොපැමිණීමට ප්‍රබල සාධකයක් වන බැවින් **ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම**
3. විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමේ දී පාදක කර ගනු ලබන **Z ලකුණ සහිත දිස්ත්‍රික් කෝටා ක්‍රමය වර්තමානයට උචිත වන අයුරින් නැවත සමාලෝචනය**

4. වෙනස් වන වෘත්තීය සහ සමාජ අපේක්ෂාවලට උචිත වන සේ **විෂයධාරා වර්ගීකරණය, විෂය අන්තර්ගතය ප්‍රායෝගිකත්වයට නැඹුරු වන සේ සැකසීම** පිළිබඳ නැවත සමාලෝචනය

5. **පාසල් කාලය තුළ උපකාරක පන්ති පැවැත්වීම තහනම් කිරීම** සහ පළාත් සභා මගින් ප්‍රකාශිත අධ්‍යාපන ප්‍රඥප්තිවලට අනුකූල ව **පෞද්ගලික උපකාරක පන්ති නියාමන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම**

6. තරඟකාරී විභාග රටාව වෙනුවට **ප්‍රායෝගික කුසලතා ප්‍රමුඛ කර ගත් තක්සේරුකරණ සංස්කෘතියට** පාසල් අධ්‍යාපනය යොමු කිරීම

7. ශිෂ්‍යයන් හට විෂයයට අදාළ **අතිරේක පොත පත පරිශීලනය කර ස්වයං අධ්‍යානයෙහි යෙදීමට මඟ පෙන්වා දී සැලසුම් සහගත ව නිපුණතා පාදක ව ශිෂ්‍ය කේන්ද්‍රීය ව මෙන් ම ක්‍රියාකාරකම් අභිමුඛව පාසල් පාදක ඇගයීම්** සිදු කිරීමට අවස්ථාව ලබා දීම හා සිසුන්, ගුරුවරුන් අභිප්‍රේරණය වන පරිදි උසස් පෙළ ප්‍රශ්න පත්‍ර අන්තර්ගතය වෙනස් කිරීම

8. **ගුරු නිවාඩුවල දී විෂය ආවරණ කිරීමේ විකල්ප වැඩ පිළිවෙලක්** ක්‍රියාත්මක කිරීම කිරීම

9. අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටීමෙන් පසු ව උසස්පෙළ පන්ති ඇරඹීම දක්වා වූ කාලසීමාව **උසස්පෙළ විෂයධාරාවලට ගැළපෙන පරිදි පූර්ව අධ්‍යයන ප්‍රායෝගික ක්‍රියාකාරකම් හඳුන්වා දීම**

10. ක්‍රියාකාරී ප්‍රබෝධජනක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා **ගුරුවරුන් සවිබල ගැන්වීම** සඳහා **ගුරු පුහුණු පාඨමාලා, පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන්** උපයෝගී කර ගැනීම

11. උසස් පෙළ ඉගැන්වීමේ වියුතු **ආධුනික ගුරුවරුන් සඳහා පාසල් පාදක උපාධ්‍යායවරු මගින් සුසාධ්‍යකරණ වැඩ පිළිවෙතක්** පාසලේ ස්ථාපිත කිරීම සහ ගුරුවරුන්ගේ ශික්ෂණ විද්‍යාත්මක කුසලතා වර්ධනය කිරීම ඉලක්ක කර ගත් ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

12. උසස් පෙළ ශිෂ්‍ය පැමිණීම, සාධන මට්ටමින් යන නිර්ණායක පාදක ව **ගුරු - සිසු දෙපාර්ශවයම ඇගයීමේ වැඩ පිළිවෙළක්** පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම

13. සිසුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය සම්බන්ද **චක්‍රලේක හා උපදෙස් ක්‍රියාත්මක කිරීමට විදුහල්පති බලගැන්වීම**

14. උසස් පෙළ විෂයධාරා තෝරා ගැනීම, විෂය ඉගෙනුම හා සබැඳි ගැටලු විසඳා ගැනිම, විභාග භීතිකාව වැනි ගැටලු සම්බන්ධ **අධ්‍යාපනික මාර්ගෝපදේශය සිසුන්ට** මෙන් ම දෙමාපිය, දරු සබඳතා ඉගෙනුමට සහාය වීම සම්බන්ධ **දෙමාපියන්ට** මග පෙන්වීම ඇතුළත් උපදේශන සේවාව සක්‍රීය කිරීම සහ පාසල්වල **වෘත්තිය මාර්ගෝපදේශන ඒකකය ශක්තිමත් කිරීම** සහ රැකියා, ඒවාට අදාළ පාඨමාලා හා ඒවා පැවැත්වෙන් ආයතන පිළිබඳ විස්තර සිසුන්ට ලබා දීම

15. උසස් පෙළ **ගුරුවරුන්** සඳහා පාසල් මට්ටමින් හෝ කලාප මට්ටමින් විෂය සම්බන්ධ ප්‍රවීණයන්ගේ **මාර්ගෝපදේශන වැඩපිළිවෙලක්** පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම

## පටුන
## Content


| | | පිටු අංකය<br>**Page No.** |
|---|---|---|
| **විධායක සංක්ෂිප්තය** | | vii - x |
| Executive Summary | | xi - xiv |
| 1.0 | හැඳින්වීම | 01 - 17 |
| 2.0 | අධ්‍යයනයේ අරමුණු | 17 - 18 |
| 3.0 | අධ්‍යයන ක්‍රමවේදය | 18 - 19 |
| 4.0 | පරිශීලනය කරන ලද පර්යේෂණාශ්‍රිත ලේඛන | 19 - 28 |
| 4.1 | අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ පාසල් නොපැමිණීම | 19 - 22 |
| 4.2 | අ.පො.ස. (උසස් පෙළ) විෂය ආශ්‍රිත අධ්‍යයන | 22 - 23 |
| 4.3 | පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු වීම | 23 - 28 |
| 5.0 | පර්යේෂණාශ්‍රිත ලේඛනවලින් ඉදිරිපත් කරන ලද අනාවරණ | 28 - 37 |
| 5.1 | සිසුන් පාසල් පැමිණීම අවම වීම හා සබැඳි අධ්‍යාපන ප්‍රතිපත්තිමය දුර්වලතා | 29 - 30 |
| 5.2 | සිසුන් පාසල් පැමිණීම අවම වීමට බලපානු ලබන පාසල කළමනාකරණය සහ පරිපාලනමය අඩුපාඩු | 30 - 31 |
| 5.3 | විෂයමාලාව සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා | 31 - 32 |
| 5.4 | අධ්‍යාපනය, පාසල හා සබැඳි දෙමාපිය සහ ශිෂ්‍ය අපේක්ෂණ | 32 - 33 |
| 5.5 | පෞද්ගලික උපකාරක පන්තිවල බලපෑම | 33 - 37 |
| 6.0 | අධ්‍යයන අනාවරණ ඇසුරින් අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් පැමිණීම වර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්දේශිත පියවර | 37 - 43 |
| 6.1 | ප්‍රතිපත්තිමය තීරණ | 37 - 39 |
| 6.2 | පෞද්ගලික උපකාරක පන්ති නියාමන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | 39 |
| 6.3 | අ.පො.ස. (උ.පෙ) විභාගය නව තක්සේරු සංස්කෘතියට අනුගත කිරීම | 39 - 40 |
| 6.4 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය | 40 - 41 |
| 6.5 | පාසල් මට්ටමේ කළමනාකරණය හා පරිපාලනය | 42 |
| 6.6 | පාසල් උපදේශන සහ වෘත්තීය මාර්ගෝපදේශන සේවාව | 42 - 43 |
| 7.0 | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 44 - 49 |

# අ.පො.ස. උසස් පෙළ පන්තිවල සිසුන්ගේ දෛනික පාසල් පැමිණීම අවම වීම සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

## 1.0 හැඳින්වීම

අධ්‍යාපනයෙන් අපේක්ෂිත පූර්ණ පෞරුෂයකින් හෙබි එලදායි පුරවැසියෙකු බිහි කිරීමෙහි ලා වගකීම විධිමත් ව ඉටු කිරීම හා සබැඳි ප්‍රමුඛතම ආයතනය පාසල වේ. (ජාතික අධ්‍යාපන කොමිසම, 2014). සාමාන්‍ය පාසල් අධ්‍යාපනය ජාතික සංවර්ධන ක්‍රියාවලියේ අනිවාර්ය අංගයකි (ජාතික අධ්‍යාපන ආයතනය, 2018). ශ්‍රී ලංකාවේ රජයේ පාසල් මගින් ක්‍රියාත්මක සාමාන්‍ය අධ්‍යාපනය මට්ටම් හතරකින් සමන්විත ය. එනම් 1 සිට 5 දක්වා ශ්‍රේණි ඇතුළත් ප්‍රාථමික මට්ටම, 6 සිට 9 දක්වා ශ්‍රේණි ඇතුළත් කනිෂ්ඨ ද්විතියික මට්ටම, 10 සහ 11 ශ්‍රේණි ඇතුළත් ජ්‍යෙෂ්ඨ ද්විතීයික - අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටම සහ 12 සහ 13 ශ්‍රේණි ඇතුළත් ජ්‍යෙෂ්ඨ ද්විතීයික - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) මට්ටම යනුවෙනි. මෙම සාමාන්‍ය අධ්‍යාපනයේ අවසාන මටට්ම විද්‍යාලතලය (Collegiate level) ලෙස ද හැඳින්වේ.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය හැදෑරීමෙන් පසු නියමිත විෂය සාධනයට සපැමිණි සිසුන් සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයට අදාළ විෂය හැදෑරීමේ අවස්ථාව ලැබේ (ජාතික අධ්‍යාපන ආයතනය, 2018). එය වසර දෙකක පාඨමාලාවක් වන අතර, එහි දී උසස් පෙළ සිසුන් විෂය තුනක් හැදෑරීම අනිවාර්ය වේ. වර්තමානයේ අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව සඳහා පාසල් පද්ධතිය තුළ විෂයධාරා හයක් (කලා, වානිජ, ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, ජෛව පද්ධති තාක්ෂණවේදය, ඉංජිනේරු තාක්ෂණවේදය) ක්‍රියාත්මක වේ. එය විෂය 63කින් සමන්විත වන අතර එක් ප්‍රධාන විෂයයක් ඉගැන්වීම සඳහා සතියකට කාලච්ඡේද 10 ක් බැගින් වසර දෙක තුළ කාල පරිච්ඡේද 600ක් වෙන් කර ඇත. ප්‍රධාන විෂයවලට අමතර ව සිසුන් සාමාන්‍ය ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය විෂය හැදෑරිය යුතුය (අධ්‍යාපන අමාත්‍යාංශය, 2016).

උසස් පෙළ විෂයධාරා සම්බන්ධ ව නව ප්‍රවණතා ලෙස තාක්ෂණ විෂයධාරාව සහ වෘත්තීය විෂයධාරාව හඳුන්වා දීම දැක්විය හැකි ය. 2013 වර්ෂයේ සිට පාසල් පද්ධතියට තාක්ෂණ විෂයධාරාව විෂයධාරාව හඳුන්වා දීමේ අරමුණ සීඝ්‍රයෙන් වෙනස් වන සමාජ අවශ්‍යතාව තුළ නිපුණතාවලින් හෙබි සිසු පරපුරක් නිර්මාණය

කිරීම සඳහා පාසල් නිපුණතා සංවර්ධනය යි. මෙම විෂයධාරාව හැදෑරීම සඳහා අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් ගණිතය සහ විද්‍යාව විෂය සමත් වී තිබිය යුතු ය (ජාතික අධ්‍යාපන ආයතනය, 2018). එසේ ම අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් උසස් පෙළට ඇතුළත් වීමේ දී ගිලිහෙන සිසුන් තම අනාගතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය දනුමෙන් හෝ නිපුණතාවලින් තොර ව සමාජයට එක් වීම රටේ සමාජ හා ආර්ථික සංවර්ධනයට අහිතකර බලපෑමක් ඇති කරයි. මෙම ගැටලු සඳහා විසඳුමක් ලෙස සිසුන්ගේ තාක්ෂණික, වෘත්තීය කුසලතා හා සමාජයීය කුසලතා සංවර්ධනය කරමින් ආර්ථික සංවර්ධනය සඳහා ඵලදායී ව දායක කර ගැනීමේ අරමුණ ඇතිව 13 වසරක අධ්‍යාපන වැඩසටහන (වෘත්තීය විෂයධාරාව) හඳුන්වා දී ඇත. එහි දී සාමාන්‍ය පෙළ සමත් හෝ අසමත් බව නොසලකා උසස් පෙළ වෘත්තීය විෂයධාරාවට ඇතුළත් වීමට අවස්ථාව ලබා දී ඇත (ජාතික අධ්‍යාපන ආයතනය, 2018).

2014 සිට 2018 දක්වා වර්ෂවල උසස් පෙළට ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යා, විෂයධාරා අනුව ව්‍යාප්තිය පහත 1 වන වගුවෙන් නිරූපණය වේ.

**1 වන වගුව.**
**උසස් පෙළට ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යා, විෂයධාරා අනුව ව්‍යාප්තිය, 2014-2018**

| විෂයධාරාව වර්ෂය | කලා | | වාණිජ | | ජෛව විද්‍යා සහ භෞතීය විද්‍යා | | තාක්ෂණවේදය | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව |
| 2014 | 213,547 | 43.98 | 125,236 | 25.79 | 118,985 | 24.50 | 27,794 | 5.72 | 485,562 |
| 2015 | 215,944 | 45.24 | 117,218 | 24.56 | 118,901 | 24.91 | 25,270 | 5.29 | 477,333 |
| 2016 | 145,408 | 34.44 | 111,883 | 26.50 | 117,382 | 27.81 | 47,473 | 11.25 | 422,146 |
| 2017 | 226,572 | 44.27 | 114,726 | 22.42 | 118,038 | 23.06 | 52,473 | 10.25 | 511,809 |
| 2018 | 245,260 | 43.55 | 120,075 | 21.32 | 132,832 | 23.59 | 65,032 | 11.55 | 563,199 |

(මූලාශ්‍රය: School Census Report -2019, Ministry of Education)

වාර්ෂික ව උසස් පෙළ සඳහා ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යා අතරින් සාපේක්ෂව වැඩි ශිෂ්‍ය ප්‍රතිශතයක් ඇතුළත් වන්නේ කලා විෂයධාරාවටය. එය 45%ට ආසන්න වේ.

වාණිජ විෂයධාරාවට ඇතුළත් වන ශිෂ්‍ය ප්‍රතිශතය 25%ට ආසන්න වන අතර එය අඩුවීමේ ප්‍රවණතාවක් පෙනෙන්නට තිබේ. විද්‍යා විෂයධාරාවට ඇතුළත් වීම 25%ට ආසන්න වේ. තාක්ෂණ විෂයධාරාවට ඇතුළත් වීම වාර්ෂික ව ක්‍රමයෙන් වැඩි වීමේ ප්‍රවණතාවක් පෙනෙන්නට තිබේ.

12 - 13 ශ්‍රේණි අයත් වන අ.පො.ස. (උ. පෙ.) අවධිය, ශිෂ්‍ය ජීවිතයේ තීරණාත්මක අවධියක් වනුයේ සහතිකකරණ සහ තේරීමේ පරීක්ෂණයක් ප්‍රමුඛ වූ උසස් සහ තෘතීයික අධ්‍යාපන ප්‍රවේශය මෙන් ම ළමා වියෙන් වැඩිහිටි වියේ සමාජ භූමිකාවට ප්‍රවේශ වන දොරටුවක් ද වන බැවිනි. මෙම අවධිය නව යෞවන අවධිය ලෙස හැඳින්වේ. එබැවින් මෙහි දී නව යෞවනයන්ගේ චින්තන හැකියාවන් පිළිබඳ ව ද අවධානය යොමු කිරීම වැදගත් වේ. නිතර වාදයට ඇදී ඒමෙන් ද විවේචනයට සහ විග්‍රහයට පෙළඹීමෙන් ද, නව යෞවනයා දක්වන්නේ එම වියට විශේෂ වූ මානසික අවශ්‍යතාවකි. ඔහු සිය නව චින්තන හැකියා සහ සංකල්ප අවබෝධය උරගා බැලීමට අවස්ථා සොයයි. වචනයේ බලය කෙතරම් ප්‍රබල දැ යි ප්‍රත්‍යක්ෂ වීමෙන් ඔහු උදම් වෙයි (විජේතුංග සහ ධර්මවර්ධන, 1995). එබැවින් මෙම අවධියේ ඉගෙනුම ද චින්තන හැකියාවට අනුගත වීමෙන් ශිෂ්‍යයා ඉගෙනීමට පෙළඹවා ගැනීමට වැදගත් වේ.

මේ නිසා අ.පො.ස. උසස් පෙළ ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය තෝරා ගැනීමට ගුරුවරයාට වැඩි නිදහසක් ලබා දී ඇත (Aturupane et al, 2011). ප්‍රායෝගික සංරචක භාවිතය, පරිපූරක කියවීම් ද්‍රව්‍ය, පරිගණක සහායිත ඉගැන්වීම් ද්‍රව්‍ය වැනි ඉගෙනුම් ඉගැන්වීම් ද්‍රව්‍ය භාවිතය සහ ශිෂ්‍ය සමාජ, ක්ෂෙත්‍ර චාරිකා, ප්‍රදර්ශන සහ තරග, ප්‍රකාශන, විවාද සහ විෂය දින වැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් භාවිතයට විෂය නිර්දේශය තුළ ඉඩකඩ ලබා දී ඇත. නිපුණතා පාදක ව, ගවේෂණාත්මක ව ඉගැන්වීමට උපදෙස් ලබා දී තිබුණ ද විෂය නිර්දේශයේ බර අධික වීමෙන් කාලය සීමිත වීම නිසා බොහෝ ගුරුවරුන් දේශන පදනම් කර ගත් ඉගැන්වීම් ශෛලියකට හුරු වී ඇත (Aturupane et al, 2011). මෙසේ සම්ප්‍රේෂණ ගුරු භූමිකාව අනුගමනය කරමින් ගතානුගතික පන්ති කාමර තුළ විෂයය ඉගැන්වීම හේතුවෙන් ප්‍රතිඵලය සාපේක්ෂව අඩු වීමට හේතුවක් විය හැකි බව ද උස්ගොඩ ආරච්චි (2020) පෙන්වා දී ඇත.

අනෙකුත් අධ්‍යාපන මට්ටම්වල දී මෙන් ම සම්භවන සහ සම්පිණ්ඩිත ඇගයීම් ක්‍රියාවලියකින් යුක්ත අ.පො.ස (උ. පෙ.) පන්ති කාමර ඉගැන්වීම්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් මෙන් ම ගුරු මාර්ගෝපදේශකත්වය යටතේ ව්‍යාපෘති හා සබැඳි පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම ද අවශ්‍ය වේ (විභාග දෙපාර්තමේන්තුව, 2010). මෙම ව්‍යාපෘති "කේවල" හා "කණ්ඩායම්" ලෙස කොටස් දෙකකින් සමන්විත විය. 2017 වර්ෂයේ දී එයින් කණ්ඩායම් ව්‍යාපෘතිය පමණක් පවත්වාගෙන යාමටත් කේවල ව්‍යාපෘතිය ඉවත් කිරීමටත් තීරණය කර ඇත (අධ්‍යාපන අමාත්‍යාංශය, චක්‍රලේඛ අංක 23/2017). මෙම පාසල් පාදක තක්සේරු කිරීමේ දී ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දීම අපේක්ෂා කර ඇත. එම මාර්ගෝපදේශ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feedback) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය බව දක්වා ඇත (ජා.අ.ආ., 2012). එසේ වුව ද පාසල් පාදක තක්සේරුව සම්බන්ධ මූලික ගැටලුව වී ඇත්තේ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය අධික ලෙස විභාග කේන්ද්‍රීය වීම යි. මේ හේතුවෙන් පාසල් පාදක තක්සේරුව සහ ජාතික මට්ටමේ විභාග අතර ඓන්ද්‍රීය සම්බන්ධතාවක් (Organic linkage) නොමැති වීමෙන්, පාසල් මට්ටමේ පාර්ශවකරුවන් පාසල් පාදක තක්සේරුවෙ හි වැදගත්කම නොසලකා හැර එම ජාතික මට්ටමේ විභාග සඳහා සිසුන් සූදානම් කිරීමට නැඹුරු වී ඇත (NIE, 2015).

අ.පො.ස. (උ. පෙ.) විභාගයෙන් ප්‍රධාන විෂය තුන සදහා සාමාන්‍ය සාමාර්ථ ද, ඉංග්‍රීසි විෂයයට පෙනී සිටීම සහ සාමාන්‍ය පොදු ප්‍රශ්නපත්‍රය සදහා 30%ක සාමාර්ථයක් ලබා තිබීම ද විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම වුව ද දැඩි තරගකාරී තත්වය නිසා සැබෑ ප්‍රවේශ මට්ටම මීට වඩා බෙහෙවින් ඉහළය. එක් එක් විෂයධාරා අනුව 2018 වර්ෂයේ දී පාසල් අයදුම්කරුවන් උසස් පෙළ විභාගයේ දී ලබා ගත් ප්‍රතිඵල විශ්ලේෂණයක් 2 වන වගුවෙන් නිරූපණය වේ.

**2 වන වගුව.**

## උසස් පෙළ විභාගයේ විෂයධාරා අනුව පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල විශ්ලේෂණය - 2018

| විෂයධාරාව | විභාගයට පෙනී සංඛ්‍යාව | වි.වි ප්‍රවේශයට අවම සුදුසුකම් ලද (විෂය3 සමත්) | | විෂය3ටම A සාමාර්ථ ලද | | විෂය 3ම අසමත් | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 1. ජෛව විද්‍යා | 34890 | 20229 | 57.98 | 548 | 1.57 | 5091 | 14.59 |
| 2. භෞතීය විද්‍යා | 27310 | 15511 | 56.80 | 709 | 2.60 | 4431 | 16.22 |
| 3 වාණිජ | 48712 | 33805 | 69.40 | 1783 | 3.66 | 3288 | 6.75 |
| 4. කලා | 83230 | 57631 | 69.24 | 1804 | 2.17 | 3423 | 4.11 |
| 5. ඉංජිනේරු තාක්ෂණවේදය | 12264 | 7165 | 58.42 | 36 | 0.29 | 1056 | 8.61 |
| 6. ජෛව පද්ධති තාක්ෂණවේදය | 8311 | 5342 | 64.28 | 26 | 0.31 | 645 | 7.76 |
| 7. වෙනත් | 3474 | 1489 | 42.86 | 6 | 0.17 | 269 | 7.74 |
| **එකතුව** | **218191** | **141172** | **64.70** | **4912** | **2.25** | **18203** | **8.34** |

(මූලාශ්‍රය. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, 2018)

උක්ත වගුව අනුව, සමස්තයක් ලෙස බලන කල විශ්වවිද්‍යාල ප්‍රවේශයට අවම සුදුසුකම් ලද (විෂය3 සමත්) පාසල් අයදුම්කරුවන් 50%ට වඩා ඉහළ අගයක් ගෙන ඇත. එහෙත් විෂය තුනම අසමත් අයදුම්කරුවන් සංඛ්‍යාව සමස්තයක් ලෙස බලන කල 8%ට ආසන්න වුවත් විද්‍යා විෂයධාරාවල දී එය 15%ට ආසන්න අගයක් ගෙන ඇත. මෙය සුවිශේෂ අවධානයට යොමුවිය යුතු කරුණ කි.

12 සහ 13 වන ශ්‍රේණිවල ඉගෙනීමෙන් පසු ශිෂ්‍යයා පෙනී සිටින අ.පො.ස උසස් පෙළ විභාගය සීමිත සිසු පිරිසකට තෘතීයික හෝ වෘත්තීය අධ්‍යාපනයට පිවිසීමට හැකි වුව ද සිසුන් බහුතරයකට අධ්‍යාපනයේ ගිලිහුම් ලක්ෂ්‍යය කි (ජාතික අධ්‍යාපන ආයතනය, 2018). උසස් පෙළ සඳහා වාර්ෂික ව සිසුන් 300,000ක ට ආසන්න සංඛ්‍යාවක් පෙනී සිටින අතර ඉන් ආසන්න වශයෙන් සියයට හැටක් විශ්ව විද්‍යාල පිවිසුම සඳහා සුදුසුකම් ලබති. එසේ වුවද, මෙම සුදුසුකම් ලත් සිසුන් අතරින් 15% ක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල සඳහා තෝරාගනු ලබන අතර ඉතිරි 85% රාජ්‍ය විශ්ව විද්‍යාල අධ්‍යාපනයට ඇතුළත් වීමට නොහැකි වන බව Alawattegama (2020) දක්වා ඇත. මෙසේ අපේක්ෂා කඩ කර ගන්නා සිසුන් මිනිස් ජීවන චක්‍රය

අනුව, අනාගත ව්‍යාසායකත්ව අපේක්ෂණ පෙරටු කරගත් පශ්චාත් යොවුන් වියේ පසුවන්නන් වීම ද අවධානයට යොමුවීම වැදගත් ය.

උසස් පෙළ විභාගයට අයදුම් කරන අවස්ථාව දක්වා වූ පාසල් පැවැත්වූ දින ගණනින් 80%ක පැමිණීම සම්පූර්ණ කර තිබීම ද අත්‍යවශ්‍ය වේ (අධ්‍යාපන අමාත්‍යාංශය, 2006). පාසලින් ලබා දෙන අධ්‍යාපනය ඵලදායී කර ගැනීම සම්බන්ධ ප්‍රධාන සාධකයක් වනුයේ දෛනිකව පාසලට පැමිණ අධ්‍යයන කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගි වීම ය (ජාතික අධ්‍යාපන ආයතනය, 2016). මේ නිසා සිසුන් නිතිපතා පාසලට පැමිණීමේ අනුපාතිකය අධ්‍යාපනයේ කාර්යසාධනයේ ඵලදායීතාව තක්සේරු කිරීමේ දර්ශකයක් ලෙස ද යොදා ගැනේ (Manimarrphan, 2014). ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි පාසල් නොපැමිණීම දැඩි සෘණාත්මක බලපෑමක් පවතින බව Sawyer (2018) පෙන්වා දී ඇත. එසේම අඛණ්ඩ ව පාසල් නොපැමිණීම (absenteeism), පාසල් අධ්‍යාපනයෙන් අතරමග දී ගිලිහී යාම (drop-outs) ජාතික වශයෙන් මෙන් ම ගෝලීය වශයෙන් ද, විධිමත් අධ්‍යාපනය හා සබැඳි ගැටලු වේ (Shakira සහ Kengatharan, 2019). ශිෂ්‍ය නොපැමිණීම යනු නියමිත කාල සීමාවක දී සිසුන් පාසලට නොපැමිණීම යි (Teasley, 2004). පාසලට සිසුන් නොපැමිණීම සම්බන්ධ දීර්ඝ කාලීන නොපැමිණීම (Chronic Absenteeism) පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇති Sawyer (2018) ඒ සඳහා පාදක කර ගනු ලබන්නේ නිදහසට කරුණු ඉදිරිපත් කර හෝ නොකර ශිෂ්‍යයා පාසල් නොපැමිණි දින ගණන බව දක්වා ඇත. දීර්ඝ කාලීන නොපැමිණීම බොහෝ විට අර්ථ දක්වන්නේ ශිෂ්‍යයා පාසලෙන් 10%ක් හෝ ඊට වැඩි දින ගණනක් නොපැමිණීම බවත් Sawyer (2018) දක්වා ඇත. එහෙත් ඇමෙරිකාවේ විවිධ ප්‍රාන්තවල මේ සඳහා විවිධ දින ගණන් පාදක කර ගන්නා බව ද සඳහන් කර ඇත. ශ්‍රී ලංකාවේ අ.පො.ස. උ. පෙළ ශිෂ්‍යයා ගෙන් පාසල් පැවැත්වූ දින ගණනින් අවම වශයෙන් 80%ක පැමිණීම අපේක්ෂා කරන බැවින් ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන නොපැමිණීම යනු ශිෂ්‍යයා පාසල පැවත් වූ දින ගණනෙන් 20%ක ට වැඩි දින ගණනක් නොපැමිණීම බව දැක්විය හැකිය. දීර්ඝ කාලීන නොපැමිණීම, පාසල්වලින් සිසුන් ඇදහැලීම වැඩි කිරීමට ද හේතු වන බව Sawyer (2018) දක්වා ඇත.

අඛණ්ඩ සිසු නොපැමිණීම කෙරෙහි බලපාන සාධක සංස්කෘතිකමය වශයෙන් මෙන් ම රටකින් රටකට සුවිශේෂී වන බව පෙන්වා දෙන Shakira සහ Kengatharan (2019) ශිෂ්‍යයා, ගුරුවරයා සහ පාරිසරික යන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් ඉදිරිපත් කර ඇත. ශිෂ්‍යයා සම්බන්ධ සාධක අතර රෝගී බව, අඩු ආදායම, සමපදස්ථයින් ගෙන් ඇති විය හැකි පීඩනය, දෙමාපිය අධ්‍යාපන මට්ටම, විෂයයට අකැමැති වීම, විභාගයට සූදානම් වීම, ගමනාගමන දුෂ්කරතා සහ අර්ධකාලීන රැකියාවල නිරතවීම යන කරුණු අයත් වේ. ගුරුවරයා සම්බන්ධ සාධක වශයෙන් ගුරුවරුන්ගේ ආකල්ප, ඉගැන්වීමේ ක්‍රම හා විෂයයට ප්‍රවේශ වීමේ ස්වභාවය, ඉගැන්වීමේ ගුණාත්මකභාවය, පන්තියේ ප්‍රමාණය, ප්‍රියජනක හා පෙළඹීමක් ඇති නොවන ඉගැන්වීමේ ශෛලිය, ගුරු නොපැමිණීම, දුර්වල ප්‍රතිපෝෂණය සහ අනෙක් ශිෂ්‍යයන්ගේ නොපැමිණීම දක්වා ඇත. පර්යේෂණ අනාවරණ අනුව පාරිසරික සාධක අතර වාතාශ්‍රය, පන්ති කාමරයේ ආසන සැකැස්ම, ඝෝෂාව, උපකරණ හිගය සහ ඉඩ මදකම ප්‍රමුඛ වේ. එසේ ම Sawyer (2018) සිසුන්ගේ පාසල් නොපැමිණීමට පවුල සම්බන්ධ සාධක, පාසල සම්බන්ධ සාධක සහ ආර්ථික බලපෑම් හේතු ද වන බව පෙන්වා දෙයි.

යෞවනයින්ගේ පාසල් නොපැමිණීම අනෙකුත් ශිෂ්‍යයන්ට සාපේක්ෂ ව ඉහළ මට්ටමක පවතින අතර එය පසුකාලීන ව පුද්ගල මෙන් ම සමාජ ගැටලු ඇතිවීමට බලපායි (Chen සහ Rice, 2016). අනෙකුත් ශ්‍රේණිවලට සාපේක්ෂ ව උසස් පෙළ පන්තිවල දී ශිෂ්‍ය පාසල් පැමිණීම අවම මට්ට්මක පැවතීම ශ්‍රී ලංකාවේ රජයේ පාසල් පද්ධතියේ කැපී පෙනෙන ලක්ෂණයකි (දමයන්ති, 2012). 12 වන ශ්‍රේණියේ ශිෂ්‍ය පැමිණීමට සාපේක්ෂ ව 13 වන ශ්‍රේණියේ දී ශිෂ්‍ය පැමිණීම ඉතා ම අවම මට්ටමක පැවතීමත් ජනවාරි සිට ජූලි දක්වා වූ කාලයේ දී පාසල් පැමිණීම අවම වීමත් වර්තමාන පාසල් පද්ධතියේ සාමාන්‍ය තත්ත්වයකි (Ministry of Education of Northern Province, 2014).

ජාතික අධ්‍යාපන ආයතනයට (2016) අනුව, 13 වන ශ්‍රේණියේ ශිෂ්‍ය පැමිණීම අවම වීම, පළාත් මට්ටමින් මෙන් ම ජාතික මට්ටමින් ද අවධානයට යොමු වීමේ අවශ්‍යතාව 3 වන වගුවෙහි දත්තවලින් පැහැදිලි වේ.

**3 වන වගුව.**

**පළාත් අනුව 13 වන ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම**

| පළාත | තෝරා ගන්නා ලද පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය නොපැමිණීමේ ප්‍රතිශතය |
|---|---|---|
| බස්නාහිර | 33 | 88.51 |
| උතුරු මැද | 21 | 88.24 |
| වයඹ | 24 | 88.11 |
| දකුණ | 33 | 77.15 |
| සබරගමුව | 21 | 77.08 |
| ඌව | 23 | 66.13 |
| නැගෙනහිර | 48 | 65.43 |
| මධ්‍යම | 36 | 60.3 |
| උතුර | 33 | 37.85 |
| ජාතික මට්ටම | 272 | 72.05 |

(මූලාශ්‍රය. ජාතික අධ්‍යාපන ආයතනය, 2016)

ඉහත 3 වන වගුව අනුව උතුරු පළාත හැරුණු විට සෙසු පළාත් අටෙහි 13වන ශ්‍රේණියේ දී පාසල් නොපැමිණීමේ ප්‍රතිශතය 60.3% - 88.51% දක්වා වූ ඉහළ මට්ටමක පවතී. ජාතික මට්ටමේ ශිෂ්‍ය නොපැමිණීමේ ප්‍රතිශතය 72% කි (ජාතික අධ්‍යාපන ආයතනය, 2016). මේ අනුව ආසන්න වශයෙන් දින 200ක් වන වාර්ෂික පාසල් කාල සීමාවෙන් දළ වශයෙන් දින 100කට වඩා සිසුන්ගේ නොපැමිණීම අධ්‍යාපනයේ සියලු පාර්ශ්වකරුවන්ගේ වගකීම (Responsibility) මෙන් ම වගවීම (Accountability) හා සබැඳි ගැටලු සහගත තත්වයකි. ජාතික අධ්‍යාපන ආයතනය (2016) තවදුරටත් අනාවරණය කරනුයේ ජාතික මට්ටමින් 13 ශ්‍රේණියේ ශිෂ්‍ය නොපැමිණීම සිසුවියන්ගේ නොපැමිණීමේ ප්‍රතිශතයට (69.74%) වඩා සිසුන්ගේ නොපැමිණීමේ ප්‍රතිශතය (74.53%) ඉහළ අගයයක ද, පාසල් වර්ගය අනුව අනෙක් වර්ගවලට සාපේක්ෂ ව 1AB පාසල්වල ඉහළ ප්‍රතිශතයක (73.6%) ද පවතින බව දක්වා ඇත. ඇතැම් පාසල් උසස් පෙළ පාඨමාලාව සඳහා වූ දෙවසරක කාලය අවසන් කිරීම වෙනුවට වසර $1\frac{1}{2}$ක දී අවසන් කිරීමට සිසුන් පොළඹවා ඇති අතර එමගින් ශිෂ්‍යයන්ට විෂය කරුණු ධාරණය කර ගැනීමට බාධාවක් මෙන් ම විෂය අන්තර්ගතය මග හැර ඉගැන්වීමට ගුරුවරුන්ට අනියම් ලෙස අනුබල දීමක් ද වීමෙන් ශිෂ්‍යයාට සෘණාත්මක බලපෑමක් ඇති කරයි. මේ අනුව උසස් පෙළ

සිසුන්ගේ පාසල් නොපැමිණීම විවිධ පැතිකඩ ඔස්සේ විවාදයට ලක් ව ඇත (ජාතික අධ්‍යාපන ආයතනය, 2016).

විවිධ රටවල පෞද්ගලික උපකාරක පන්ති ව්‍යාපාරය, ඡායා අධ්‍යාපන පද්ධතියක් (Shadow Education System) ලෙස හඳුන්වා ඇති බ්‍රේ (1999) එමගින් ඇතැම් පසුබිමක පාසල් පද්ධතිය කෙරෙහි ඍණාත්මක ලෙසට ද බලපා ඇති බව දක්වා ඇත. ප්‍රධාන බාහිර විභාග සමීප වන අවස්ථාවක දී සමහර රටවල සමහර සිසුන්, තමන්ගේ විභාග සඳහා සුවිශේෂ වශයෙන් අවශ්‍ය වන දේ සැපයීමට තම පාසලට නොහැකි බවට සැක සංකා ඇති කර ගන්නා බවත්, බොහෝ සිසුන්ට අසනීප බවට ලබාගැනීමට හැකි ව්‍යාජ වෛද්‍ය සහතික ඉදිරිපත් කර පාසල මඟ හැරීමට කටයුතු කරන බවත් දක්වා ඇත. තම පාසල් කාලයේ ද්විතීයික තලයේ අවසාන ශ්‍රේණියේ දී සිසුන් සාමාන්‍යයෙන් පාසලේ පාඩම් මඟහැර පෞද්ගලික උපකාරක පන්ති සඳහා පාසල් කාලය තුළ ම යොමු වන බව ද පෙන්වා දෙයි. එවන් කාල සීමා තුළ පාසල් පන්ති කාමර බොහෝ සෙයින් හිස් බවක් දක්නට ලැබෙන අතර මේ වේලාවේ දී සිසුන් පෞද්ගලික උපකාරක අධ්‍යාපනය පාසලෙන් පිටත දී ලබා ගනිමින් සිටින බවත් දක්වයි. පෞද්ගලික උපකාරක අධ්‍යාපනයේ තීව්‍රතාව සිසුන්ගේ චිත්ත ඒකාග්‍රතාවට (concentration spans) ද බලපෑම් කරයි. සිසුන්ගේ ප්‍රබල විශ්වාසය වී ඇත්තේ පෞද්ගලික උපකාරක අධ්‍යාපන මධ්‍යස්ථාන මගින් ලබා දෙන දැනුම විභාගය සඳහා වඩාත් අදාල වන බවයි. මේ නිසා පෞද්ගලික උපකාරක අධ්‍යාපන මධ්‍යස්ථානවලට විශාල ඉල්ලුමක් ඇති වී තිබේ. එහි පැමිණ ඉගෙන ගන්නා සිසුහු පාසලට පැමිණියත් පාසල් වේලාවේ දී සාමාන්‍යයෙන් පාසලේ පන්ති කාමරයේ කටයුතු සඳහා ක්‍රියාකාරී ව සහභාගි නොවී උදාසීන ව කටයුතු කරන බව ද දක්වා ඇත. පෞද්ගලික උපකාරක පන්තිවල ඉගැන්වීම සාමාන්‍යයෙන් උපකාරී වන්නේ ඉහළ සාධන මට්ටම්වල සිටින සිසුන්ට වන අතර පාසල් ගුරුවරුන්ගේ ශික්ෂණ ක්‍රමවේද පෞද්ගලික පන්තිවල ක්‍රමවේද වලට වඩා වෙනස් විය හැකි වීම ද අභියෝගයක් බව පෙන්වා දී ඇත. උදාහරණයක් වශයෙන් ගණිතය විෂයයේ දී යාන්ත්‍රික ව ගැටලු විසඳීමේ ආකාර පෞද්ගලික පන්තිවල දී ඉගෙන ගන්නා නමුත් ඒ සමග අනුබද්ධ වන මූලධර්ම ගැන අවබෝධයක් නොලබන අවස්ථා ද අනාවරණය වී ඇති බව පෙන්වා දෙයි. පෞද්ගලික පන්තිවල ඉගැන්වීමේ නියුතු අයට පාසලේ ගුරුවරුන් සමඟ අදහස් හුවමාරුවක් නොමැති වීම හේතුවෙන් ඒකාබද්ධ ඉගෙනුම් වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා පාසලට ඇති හැකියාව

දුර්වල වී ඇති බව ද පෙන්වා දී ඇත. සිසුන් බාහිරව ඉගෙන ගන්නා බැව් දන්නා නිසා පාසලේ ගුරුවරුන් තම කටයුතු අතපසු කිරීමට ඇති හැකියාව ද ගැටලුසහගත බව දක්වා ඇත. බොහෝ විට මෙවැනි ගුරුවරුන්, පෞද්ගලික උපකාරක පංති ද පවත්වන අය ම විය හැකි බව ද සඳහන් කර ඇත. විෂයමාලා සංවර්ධන බලධාරින් විසින් නිර්දේශ කරන ඉගෙනුම් ක්‍රමවේද නොසලකා හැරීම, පාසලේ සහ පෞද්ගලික උපකාරක පංතියේ යන ආකාර දෙකක වැඩ ප්‍රමාණය අධික වීම නිසා සිසුන්ට ඇතිවන තෙහෙට්ටුව පන්ති කාමරයේ ක්‍රියාකාරකම් කෙරෙහි උනන්දුව හීන වන බවත් පෞද්ගලික උපකාරක පංතියේ පාඩම් වලදී ලැබුණ හෝඩුවා පාවිච්චි කරමින් සිසුන් යාන්ත්‍රික ලෙස වැඩ කිරීම (Poisson, 2007) ද පාසලට සිසුන් පැමිණීම කෙරෙහි සෘණාත්මක බලපෑම් එල්ල වන බව බ්‍රේ (1999) තව දුරටත් පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුවට (2009) පෞද්ගලික උපකාරක පන්තිවලින් පාසලට එල්ල වන තර්ජනය ගැන පහත අදහස් ඉදිරිපත් කර ඇත.

***“පෞද්ගලික උපකාරක පන්ති සඳහා ඉල්ලුම ක්‍රම ක්‍රමයෙන් වැඩි වන බැවින් ඒවා ශීඝ්‍රයෙන් පැතිරෙමින් පවතී. පෞද්ගලික උපකාරක පන්ති ව්‍යාපාරය දැන් විකල්ප අධ්‍යාපන පද්ධතියක් බවට පත් වී ඇත. එසේ ම එය ලාභදායි ව්‍යාපාරයක් බවට ද පත් ව තිබේ.***
***13 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ පැමිණීම භයානක ලෙස පහත වැටෙන බව ප්‍රසිද්ධ කරුණකි. එසේ ම පාසල් සංස්කෘතිය හරහා සමතුලිත පෞරුෂයක් ගොඩනැගීමට අවශ්‍ය විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට සිසුන්ගේ සහභාගිත්වය ද මේ නිසා බරපතල අන්දමින් සීමා වේ. සිසුන් ගෙන් වැඩි දෙනෙක් දිනකට පැය10 ක පමණ කාලයක් පෞද්ගලික උපකාරක පන්ති සඳහා වැය කරන බැවින්, පාසලේ වෙනත් ක්‍රියාකාරකම්වල යෙදීමට කාලයක් ඔවුන්ට නැත. එතකුදු වුවත්, මෙම තරග විභාග පසුතලය යටතේ සිසුන් මෙන් ම දෙමාපියන් විසින් ද සලකනු ලබන්නේ, ටියුෂන් පන්තිවලට සහභාගි වීම, අඩු වැඩි වශයෙන් අත්‍යවශ්‍ය බවට පත්ව ඇති බවයි. ටියුෂන් පන්ති ශිෂ්‍යයකුගේ ශාස්ත්‍රීය ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී තිබේ. ඔවුන්ගේ දෘෂ්ටි කෝණයෙන් බැලූ කල මෙහි සාධාරණත්වයක් තර්කානුකූලභාවයක් පෙනෙන්නට තිබුණත්, පාසලෙන් බාහිර ව ඉගෙනීමට හුරු***

***කරවීමේ ක්‍රමය මගින්, සමාජ පරිශෝධනයේ මූලික අඩිතාලම වන පාසලට එමගින් එල්ල වන තර්ජනය බරපතල ය."*** (පිටුව 121).

කෙසේ වුව ද, පෞද්ගලික අතිරේක (ටියුෂන්) පන්තිවලින් ශිෂ්‍ය සාධනයට වන බලපෑම ද විවාදිත කරුණකි. Nga, et al. (2016) ට අනුව දෙමාපියන් විසින් තම දරුවන් ටියුෂන් පන්තිවලට යොමු කළ ද, ටියුෂන් පන්තිවල ගත කරනු ලබන කාලය, දරුවන්ගේ සමුච්ඡිත ශ්‍රේණි සාමාන්‍යය (cumulative grade point average) (CGPA) කෙරෙහි සෘණාත්මක බලපෑමක් එල්ල වී ඇත. මෙමගින් පෙන්නුම් කෙරෙන්නේ ටියුෂන් පන්තිවලට සිසුන් යොමු වීමෙන් ඔවුන් ගේ සාධන මට්ටම්වල ඉහළ යාමක් අනිවාර්යයෙන් සිදු නොවන බව යි. විශේෂයෙන් ම මෙහිදී දෙමාපියන් ගෙන් සිසුන්ට එල්ල වන බලපෑම නිසා සිසුන් ටියුෂන් පන්තිවලට සහභාගි වුවද, ඊට සිසුන්ගේ රුචිකත්වයක් හෝ අපේක්ෂාවක් නොමැති වීම නිසා ඉගෙනුමට අභිප්‍රේරණය නොවීමෙන් අධ්‍යාපන සාධනය පහළ යන බව Nga, et al. (2016) දක්වා ඇත.

මේ අනුව අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල සිසුන්ගේ දෛනික පාසල් පැමිණීම කෙරෙහි පෞද්ගලික උපකාරක පන්තිවලින් ද බලපෑම් එල්ල වන බව ද, ශිෂ්‍ය පෞරුෂය හා සබැඳි පාසලේ කාර්යභාරය දැඩි ලෙස අභියෝගයට ලක් ව ඇති බව ද සඳහන් කළ හැකිය. විභාගයට සාර්ථක ව මුහුණ දීය හැකි බවට ඇති පිළිගැනීම, විධිමත් පාසලේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය පිළිබඳව සෑහීමට පත් නොවීම සහ විෂයමාලාවේ අධිකතර බව නිසා සිසුන් පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු වීම, පෞද්ගලික උපකාරක පන්තිවල ක්‍රියාකාරීත්වය හමුවේ පාසල් පද්ධතිය බිඳ වැටීමත් මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලය අධ්‍යාපනයේ පවත්නා අසාධාරණය තවදුරටත් ඉහළ යාම බව ද දැක්විය හැකිය (ජාතික අධ්‍යාපන ආයතනය, 2016).

මෙම සියළු කරුණු සැලකූ විට උසස් පෙළ සිසුන්ගේ දීර්ඝ කාලීන පාසල් නොපැමිණීමට පාසල අභ්‍යන්තර හේතු මෙන්ම පාසලෙන් පරිබාහිර කරුණු ද බලපා ඇත. අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳ ගැටලුව අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සැලකීමේ දී භෞතික මෙන් ම මානව සම්පත් නාස්තියකි. එනම් පාසල් නොපැමිණෙන සිසුන් පිරිස සඳහා පාසල වෙන් කරන

ලද භෞතික සම්පත් හා මානව සම්පත් (ගුරුවරුන් සඳහා ගෙවන වැටුප් ආදිය) අපතේ යාමක් වන අතර නියමිත කාල සීමාවට පෙර පාසලින් බැහැර වීම අධ්‍යාපන ප්‍රතිපත්තිවලට අනුව නිදහස් අධ්‍යාපනය, සම අධ්‍යාපන අවස්ථා සහ අධ්‍යාපන අරමුණු අර්ථාන්විත කර ගැනීමට බාධා පමුණුවන්නකි. තම දරුවන් පාසල් නොයැම දෙමාපියන්ට සහ සමාජයට පාසල පිළිබඳ ව ඇති විශ්වාසය බිඳ වැටීමට තුඩු දෙන සමාජීය ගැටලුවක් වනුයේ අපචාර, රංචු ගැසීම්, නීති විරෝධී ඇබ්බැහිකම් ආදී සමාජ ගැටලුවලට හේතු වන බැවිනි (ජාතික අධ්‍යාපන ආයතනය, 2016).

උසස් පෙළ සම්බන්ධ ව පවතින අධ්‍යාපනික ගැටලු පිළිබඳ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009) පහත අදහස් ඉදිරිපත් කර ඇත. ***"අ.පො.ස. (උ.පෙ.) විභාගය සම්බන්ධයෙන් පවතින නිෂේධනීය ලක්ෂණ පවතින්නේ වඩාත් ඉහළ මට්ටමක ය. මක් නිසා ද යත්, එම විභාගය, අතිශය තරගකාරී විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය හා බැඳී පවතින බැවිනි. පාසල් විෂයමාලා නිර්දේශ පැත්තෙන් බලන විට, අ.පො.ස. (සා.පෙ.) සහ අ.පො.ස. (උ.පෙ.) විභාග ශිෂ්‍යයන්ගේ සමාජ පැවතුම් ගුණාංග සහ සන්නිවේදන දක්ෂතා ඔප් නංවන, රැකියා නියුක්තියට අදාළ කුසලතා මතු කරන, බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි සීමාවන් පනවන විභාග වේ.***

***විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා ලකුණු ලබා දීමේ දී, විෂයයන් සමූහයක් සඳහා ලැබෙන දළ ලකුණුවල එකතුව ගණන් ගැනීමේ සාධාරණත්වය විවාදයට භාජනය වී ඇති අතර, එය එසේ පිළිගැනීමට ලක් වී ඇත්තේ, ඉතා නිර්ධය මිථ්‍යා සංකල්පයක් මත පිහිටා ය. සිදු කරන ලද අධ්‍යයනයකින් අනාවරණය වී ඇත්තේ, ඇතැම් සිසුන් සමහර පහසු විකල්ප විෂයයන් තෝරා ගැනීම නිසා විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් තෝරා ගැනීමේ දී සාධාරණය ඉටු වී ඇද්ද, යන්න යි. විභාග දෙපාර්තමේන්තුව සහ ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවය විසින් ඉතා සුපරීක්ෂාකාරීව සහ පරෙස්සමින් කටයුතු කර තිබිය දී පවා අන්තර් ලකුණු වෙනස් කිරීම් සහ විවිධ ප්‍රශ්න සංයෝජනයන් හේතු කොට ගෙන බරපතල නොගැළපීම් සිදු වන බව පෙනී ගොස් ඇත."*** (පිටුව 99).

උසස් පෙළ සිසුන් මුහුණ පා ඇති උක්ත අධ්‍යාපනික ගැටලු විසඳීම පිණිස විවිධ අවස්ථාවල විවිධ යෝජනා ඉදිරිපත් වී ඇත (ජා.අ.කො.ස., 2016; ජා.අ.ආ., 2019).

විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා ඇති තරඟය හේතුවෙන් අ.පො.ස උසස් පෙළ අතිශයින් තරඟකාරී විභාගයක් වේ. එම නිසා එය සමස්ත පාසල් අධ්‍යාපන පද්ධතියම විකෘති කර තිබේ. මෙම අවධියේදී ශිෂ්‍යයන් අති බහුතරයකට බොහෝ සෙයින් අදාළ නැති සහ පීඩාකාරී විෂය අන්තර්ගත මත සම්මතයන් විශ්වවිද්‍යාල පනවති. ඊට පටහැනිව, ජීවත්වීම සහ වැඩ ලෝකය සඳහා අත්‍යවශ්‍ය නිපුණතා ශිෂ්‍යයන් විසින් ලබාගත යුතු වේ. එපමණක්ද නොව, පාසල හැර යන සහ රැකියා සොයා යන හෝ වෙනත් තෘතියික පුහුණු අවස්ථාවන්හි දිගටම යෙදී සිටින ශිෂ්‍යයන් අතිවිශාල බහුතරයකට උසස් පෙළ වැඩසටහන ප්‍රයෝජනවත් විය යුතු වේ. ඉහත සඳහන් සියල්ල සැලකිල්ලට ගැනීමේදී උසස් පෙළ විභාගය පාසල් හැර යාමේ අවසාන විභාගය බවට පත් කිරීම අවශ්‍ය වේ (ජා.අ.කො.ස., 2016).

එසේම ජා.අ.ආ. (2019) දක්වා ඇති පරිදි, ***"අ.පො.ස. (උ.පෙළ) විභාග සහතිකය, පාසල් හැරයාමේ සුදුසුකමක් ලෙස පිළිගත යුතු ය. එය විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයක් නොවිය යුතු අතර ශිෂ්‍යයාගේ ප්‍රාප්ති මට්ටම ඉන් පිළිඹිබු විය යුතු ය. සිසුනට 21වැනි සියවසෙහි වැඩලෝකයට අවශ්‍ය ප්‍රවීණතාව සාධනය කර ගැනීමට අවස්ථා සැලසීම, වෘත්තියාභිමුඛ මාර්ගෝපදේශ සේවාවක් ආරම්භ කිරීම, පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියේ විශ්වාසනීයත්වය හා වලංගුතාව තහවුරු කිරීම, වර්තමාන පොදු සාමාන්‍ය පරීක්ෂණ පූර්ණ අභියෝග්‍යතා පරීක්ෂණයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම, විශේෂිත ක්ෂෙත්‍රවලින් තෝරා ගන්නා ලද විෂය දෙකකින් හා විෂය කට්ටලයකින් තෝරා ගත් විෂයයකින් යුක්ත වන සේ විෂය සංයෝජනය සිදු කිරීම එම යෝජනා අතර වේ. එසේ ම උසස් පෙළ සඳහා අඩු ඉල්ලුමක් සහිත විෂය විභාගයෙන් බැහැර කිරීම, වැඩි පිරිසකගේ එකඟතාව ප්‍රකාශ වූ අනෙකුත් ප්‍රධාන යෝජනාව විය."*** (පිටුව 03).

මෙම කරුණු සලකා බැලීමේ දී පෙනී යන්නේ උසස් පෙළ සිසුන් දීර්ඝ කාලීන ව පාසල් නොපැමිණීමේ ගැටලුව හුදකලා සංසිද්ධියක් නොවන අතර එය විසඳීම පිණිස උසස් පෙළ සිසුන් මුහුණ පා ඇති විවිධ ගැටලු සහ ඒවා විසඳීම පිණිස සිදු කර ඇති පර්යේෂණ අනාවරණ පදනම් කර ගෙන යෝජනාවලියක් ඉදිරිපත් කිරීම කාලීන ව වැදගත් බව ය. එමගින් ශිෂ්‍යයන්ගේ නිදහස් අධ්‍යාපන අයිතිය තහවුරු වනු ඇත. මේ සඳහා සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ස්වභාවය, එම සිසුන්ගේ පාසල් නොපැමිණීම සම්බන්ධ ගැටලුව විසඳීමට ඉදිරිපත් ව ඇති නිර්දේශ සහ

යෝජනා තුලනාත්මක ව අධ්‍යයනය කර සිසුන්ගේ පාසල් පැමිණීම වර්ධනය කිරීම සඳහා වන පර්යේෂණවලින් ඉදිරිපත් කර ඇති අනාවරණ සහ නිර්දේශ අධ්‍යයනය කර ඒ සඳහා ගත යුතු පියවර ඉදිරිපත් කිරීම මෙම ලේඛන අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

## 2.0 අධ්‍යයනයේ අරමුණු

1. අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල සිසුන්ගේ දෛනික පාසල් පැමිනීම අවම වීම සම්බන්ධ ව සිදු කර ඇති අධ්‍යයන පාදක කර ගෙන එම සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ස්වභාවය සහ ඊට බලපා ඇති සාධක අනාවරණය
2. අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල සිසුන්ගේ දෛනික පාසල් පැමිනීම ප්‍රවර්ධනය පිණිස එම අධ්‍යයනවලින් ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා විමර්ශනය කිරීම

## 3.0 අධ්‍යයන ක්‍රමවේදය

අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබුවේ ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනය (Qualitative systematic review) යි. ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනය යනු කිසියම් මාතෘකාවක් පිළිබඳ ව පවත්නා සාහිත්‍ය පරිපූර්ණ ව, සවිස්තරාත්මක ව සහ ගුණාත්මක ව සමාලෝචනයට භාජනය කිරීම යි. ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනයකින් පර්යේෂණාත්මක සාක්ෂ්‍ය එකට කැටි කිරීමෙන් අදාළ ක්ෂෙත්‍රයේ ව්‍යවහාර සහ කාර්ය තේරුම් ගැනීමට උපකාර වේ (Seers, 2015). ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනයකින් සිදුවීම්වලට හේතු සොයා ගැනීමෙන් අවබෝධය පුළුල් කර ගත හැකි ය. ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනය වඩා මෑතක දී සංවර්ධනය කරනු ලැබූ ක්‍රමවේදයක් වන අතර තවමත් විකාශනය වෙමින් පවතී (Seers, 2015). ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනයේ පියවර හතක් Galdas, Darwin, & Fell et al. (2015) ඉදිරිපත් කර ඇත. ඉන් පළමු පියවර වන්නේ ආරම්භ කිරීම යි. මෙයට, අදාළ පර්යේෂණ ප්‍රශ්න හඳුනා ගැනීම සහ සාහිත්‍ය විමර්ශනයට අදාළ මූලික රීතිමාලාවක් සංවර්ධනය ද අයත් වේ. දෙවන පියවරේ දී, අදාළ වන්නේ මොනවා දැයි තීරණය කළ යුතු ය. මෙයට සෙවුම් ක්‍රමෝපාය (Search strategy), ඇතුළත් කිරීමේ නිර්ණායක (Inclusion criteria), තත්ත්ව

ඇගයීම (Quality appraisal) සහ සෙවුම් ප්‍රතිඵල (Search outcome) යන කරුණු ගැන තීරණය කිරීම අයත් වේ. අවසන් පියවර පහේ දී, දත්ත උපුටා ගැනීම සහ දත්ත විශ්ලේෂණය සිදු වේ. ඒ අනුව තෙවැනි පියවර වන්නේ අධ්‍යයන වාර්තා කියවීම යි. සිවුවන පියවරේ දී එම අධ්‍යයන වාර්තාවල පවතින අන්‍යෝන්‍ය සබඳතා තීරණය කළ යුතු ය. පස්වන පියවරේ දී එම අධ්‍යයන වාර්තා එකිනෙක ගළපා ගත යුතු ය. හයවන පියවරේ දී ඒවා සංස්ලේෂණයට භාජනය කළ යුතු ය. හත්වන පියවරේ දී එම සංස්ලේෂණ විස්තර කළ යුතු ය (Galdas, Darwin, & Fell et al., 2015). මේ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණාත්මක සාක්ෂ්‍ය ගවේෂණය, හඳුනා ගැනීම, තෝරා ගැනීම, ඇගයීම සහ සංස්ලේෂණය යන මූලික කාර්ය ඉටු කරන ලදි. මෙහි දී අධ්‍යයනයේ අරමුණු තීරණය කිරීම, අධ්‍යයනය සඳහා ඇතුළත් කරන (Inclusion) සහ බැහැර කරන (Exclusion) නිර්ණායක තීරණය කිරීම, ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය ඇසුරින් අදාළ සාහිත්‍ය හඳුනා ගැනීම, එම අධ්‍යයනවල ගුණාත්මකභාවය තක්සේරු කිරීම, අධ්‍යයනවලින් අදාළ පර්යේෂණාත්මක දත්ත උකහා ගැනීම, දත්ත විශ්ලේෂණය, ප්‍රතිඵල සමාලෝචනයට භාජනය කර නිගමනවලට එළැඹීම හා යෝජනා ඉදිරිපත් කිරීම යන පියවර අනුගමනය ලදි.

## 4.0 පරිශීලනය කරන ලද පර්යේෂණාශ්‍රිත ලේඛන

මෙම මාතෘකාව සම්බන්ධ ව හඳුනා ගන්නා ලද තේමා වන අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල සිසුන්ගේ පාසල් නොපැමිණීම, අ.පො.ස. (උසස් පෙළ) විෂය ආශ්‍රිත අධ්‍යයන සහ පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු වීම යන තේමා යටතේ සිදු කර ඇති අධ්‍යයන පහළොවක් පරිශීලනය කරන ලදි. එම එක් එක් තේමාව යටතේ එම අධ්‍යයන සංක්ෂිප්ත ව දක්වා ඇත.

### 4.1 අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ පාසල් නොපැමිණීම

මේ යටතේ පර්යේෂණ මූලාශ්‍ර පහක් විමර්ශනය කොට ඇත.

මේ සම්බන්ධ ව පරිශීලනය කරන ලද පළමු වැන්න වන්නේ ශ්‍රී ලංකාවේ පාසල්වල 13 වන ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනය (2016) කරන ලද අධ්‍යයනය යි. එය පාසල් නොපැමිණීම හා සබැඳි

ගැටලුවට පිළියම් හඳුනා ගැනීමේ මූලික අධ්‍යයනයක් ලෙස ක්‍රියාත්මක ව ඇත. 13 වන ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීමට අදාළ විචල්‍ය හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීමට පවත්නා අවකාශ පැහැදිලි කර ගැනීම ප්‍රධාන අරමුණ විය. සිසුන්ගේ පාසල් නොපැමිණීම හා බැඳුණු සංකල්ප, එම සිසුන්ගේ පාසල් නොපැමිණීමේ ස්වභාවය සහ සිසුන්ගේ පාසල් නොපැමිණීම හා සබැඳි සිසු, දෙමාපිය, ගුරු, විදුහල්පති වශයෙන් වන පාර්ශවකරුවන්ගේ සංජානන හඳුනා ගනිමින් පාසල් නොපැමිණීම අවම කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම යන සුවිශේෂි අරමුණු විය. අධ්‍යාපන කලාප 98 කින් විදුහල්පති, ගුරු, සිසු දෙමාපිය වශයෙන් වූ නියැදියකින් සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුම් ප්‍රවේශය යොදා ගනිමින් පන්ති කාමර නිරික්ෂණ, ලේඛන අධ්‍යයන, ප්‍රශ්නාවලි සහ නාභිගත සම්මුඛ සාකච්ඡා යන බහුවිධ ප්‍රවේශ ඔස්සේ පර්යේෂණය සිදු කර ඇත.

දෙවැන්න, දකුණු පළාතේ පාසල්වල 13 වන ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් පැමිණීම අවම වීම යන මැයෙන් අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය (2019) කළ අධ්‍යයනය යි. එය දකුණු පළාතේ අ.පො.ස. (උ.පෙ.) සිසුන් පාසල් පැමිණීමේ ගැටලුවේ ස්වභාවය හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය පිළියම් සෙවීම අරමුණු වී ඇත. සමීක්ෂණ ක්‍රමවේදය මගින් අධ්‍යාපන කලාප 11ක නියෝජනය වන පරිදි තෝරා ගත් පාසල් 25ක අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ දිනපතා පාසල් පැමිණීම පිළිබඳ ශිෂ්‍ය පැමිණීමේ ලේඛන (Daily attendance registers) ඇසුරින් ලබා ගත් දත්ත සහ සිසු, ගුරු සහ විදුහල්පති යන නියැදි තුනකින් ලබා ගත් දත්ත, පරිගණක යෙදවුම් මෘදුකාංගයක් ඇසුරින් විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම අනුව විශ්ලේෂණය කර අනාවරණ සහ නිර්දේශ ඉදිරිපත් ව ඇත.

මේ යටතේ විමර්ශනයට ලක් කළ තෙවන අධ්‍යයනය වන්නේ උ.පෙ. සිසුන්ගේ පාසල් පැමිණීමේ විවිධ රටා හඳුනා ගැනීම අරමුණු කර ගෙන ගුණසේකර (2007) විසින් අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් පැමිණීමේ රටා පිළිබඳ වූ අධ්‍යයනය යි. අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් පැමිණීමේ රටා අනාවරණය කර එම පාසල් පැමිණීමේ විවිධ රටා කෙරෙහි බලපාන සාධක, උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීම සම්බන්ධ අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේ ප්‍රමාණය හඳුනා ගනිමින් ඒ සඳහා වන ප්‍රතිකර්ම යෝජනා කිරීම පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වේ. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිසර විවිධත්වය, ග්‍රාමීය නාගරික බව මෙන් ම පාසල්

වර්ග සහ උසස් පෙළ විෂය ධාරා නියෝජනයෙන් තෝරා ගැනුණු 2006 වර්ෂයේ අ.පො.ස. (උ.පෙ.) විභාගයට පෙනී සිටි සිසුන් ස්තර ගත අහඹු නියැදියකින් ද, එම නියැදියේ සිසුන් ඉගෙනීම ලබන පාසල්වල විදුහල්පතිවරුන්, එම සිසුන්ට උගන්වන පාසල් ගුරුවරුන්, එම සිසුන්ගේ දෙමාපියන් උපකාරක (ටියුෂන්) පන්තිවල උගන්වන ගුරුවරුන් ද යොදා ගෙන ඇත. සිසුන් වෙතින් ප්‍රශ්නාවලියකින් ලබා ගත් තොරතුරු සහ සිසුන්ගේ පැමිණීම පිළිබඳ පන්ති නාමලේඛනවලින් ලබා ගත් තොරතුරු, විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ දෙමාපියන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ගැඹුරින් එළිදරව් කර ගෙන ඇත. මෙහි දී ලැබුණ දත්ත සවිස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණයෙන් සහ ගුණාත්මක විශ්ලේෂණයෙන් අනාවරණ ලබා ගෙන ඇත.

සිව්වැන්න උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීම වැඩි දියුණු කිරීම සඳහා වූ ක්‍රියාමූලික පර්යේෂණය මැයෙන් චන්ද්‍රලතා (2014) විසින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යයනය යි. මෙහි ප්‍රධාන අරමුණ ගුරුවරයාගේ පාර්ශ්වයෙන් සිසු පැමිණීම අවම වීම සම්බන්ධ ගැටලුව විසඳීම සඳහා වන ක්‍රියාමාර්ග පරීක්ෂාවට ලක් කිරීම යි. මූලික මට්ටමේ දී ශිෂ්‍ය ඉගෙනුම් අවශ්‍යතා හඳුනා ගනිමින් විෂය නිර්දේශ ඉක්මනින් අවසන් කිරීම, පුනරීක්ෂණ අභ්‍යාස සහ ප්‍රශ්නපත්‍ර යොදා ගැනීම සහ ව්‍යාපෘති ඉගෙනුම් කටයුතුවලට බාධා නොවන අයුරින් මෙහෙයවීම යන ප්‍රධාන ක්ෂේත්‍ර තුන යටතේ මැදිහත් වීම් තුනක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ගුරුවරයාගේ කාර්යභාරය වෙනස් කරමින් 13 වන ශ්‍රේණියේ සිසුන් ඉලක්කගත ව කරන ලද අධ්‍යයනයේ දී ශිෂ්‍ය පැමිණීම වර්ධනය කිරීම මෙන් ම ගුරුවරයා වෙනස්වෙමින් ගුරු - සිසු සබඳතාව ශක්තිමත් කිරීම ඉලක්කය වී ඇත.

ශ්‍රී ලංකාවේ සිසුන්ගේ පාසල් නොපැමිණීම හා සබැදි සාධක හඳුනා ගැනීමේ අරමුණින් ශකීරා සහ කෙන්ගදරන් (Shakira සහ Kengatharan, 2019) විසින් සමීක්ෂණ පර්යේෂණ ක්‍රමවේදය පාදක ව කර ඇති අධ්‍යයනය පස්වැන්න යි. අ.පො. ස උසස් පෙළ කලා සහ වාණිජ පාඨමාලා හදාරන ජාතික පාසල් පහක් නියෝජනය වන ශිෂ්‍ය නියැදියකින් ශිෂ්‍ය කැමැත්ත, ගුරුවරු හා විෂයමාලාව, භෞතික හා මානව ශක්‍යතාව, විෂයබාහිර ක්‍රියාකාරකම්, පන්තිකාමර පහසුකම්, පාසලින් බැහැර සහ පෞද්ගලික සාධක යන තේමා පාදක ව ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස් කර අනාවරණ ඉදිරිපත් කර ඇත.

## 4.2 අ.පො.ස. (උසස් පෙළ) විෂය ආශ්‍රිත අධ්‍යයන

මේ යටතේ පර්යේෂණ මූලාශ්‍ර දෙකක් විමර්ශනය කොට ඇත.

අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය විෂයයෙහි සාධනය කෙරෙහි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය ප්‍රතිඵලයෙහි බලපෑම මැයෙන් අධ්‍යයනයක් උස්ගොඩ ආරච්චි (2020) විසින් සිදු කර ඇත. මෙහි දී අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය විෂයයෙහි සාධනය කෙරෙහි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය විෂය ප්‍රතිඵලයෙහි බලපෑම පිළිබඳ විශ්ලේෂණයට ලක් කර ඇත. නියැදිය ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසුන් 125ක්,, ගුරුවරු 6ක් හා ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙපළක් යොදා ගෙන ඇත. ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශ දෙකම භාවිත කර ඇත. දත්ත රැස්කිරීමට ප්‍රශ්නාවලි, විධිමත් හා අවිධිමත් සම්මුඛ සාකච්ඡා උපයෝගී කර ගෙන ඇත. ලබා ගත් දත්ත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව විශ්ලේෂණය කර ඇත.

බලන්ගොඩ අධ්‍යාපන කලාපයේ පාසල් සම්බන්ධ ව විශේෂ අවධානය යොමු කරමින් අ.පො.ස. (උසස් පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි පාඨමාලාව පිළිබඳ ශිෂ්‍ය ආකල්ප සම්බන්ධ පර්යේෂණයක් Abeywickrama (2008) විසින් සිදු කර ඇත. සමීක්ෂණය සඳහා බලන්ගොඩ අධ්‍යාපන කලාපයේ පාසල් ධූරාවලියේ ඉහළම මට්ටමේ පිරිමි පාසලකින් හා බාලිකා පාසලකින් ද, ග්‍රාමීයව පිහිටි මිශ්‍ර පාසල් දෙකකින් ද, සිසුන් 40 දෙනෙකු තෝරා ගෙන ඇත. දත්ත රැස්කිරීම සඳහා විවෘතාන්ත ප්‍රශ්න සහ ස්ථාවර විකල්ප සහිත ප්‍රශ්න (questions with fixed alternatives) යන වර්ග දෙක ම ඇතුළත් ප්‍රශ්නාවලියක් ලබා දී ඇත.

## 4.3 පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු වීම

අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල සිසුන්ගේ පාසල් නොපැමිණීම කෙරෙහි ඔවුන් පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට (ටියුෂන්) යොමු වීමෙන් බලපෑමක් ඇති බව ලේඛන ඇසුරින් හඳුනාගත හැකිය. එබැවින් මෙම අධ්‍යයනයේ තෙවැනි තේමාව ලෙස අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල සිසුන් පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට යොමු වීම සම්බන්ධ පර්යේෂණ මූලාශ්‍ර අටක් විමර්ශනය කර ඇත.

පළමුවැන්න කොඩිතුවක්කු (1992) විසින් ශ්‍රී ලංකාවේ රජයේ පාසල් හි 13 වසරේ සිංහල මාධ්‍ය සිසුන් මුදල් ගෙවා පෞද්ගලික පන්තිවල අධ්‍යාපනය ලැබීම සිසුන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් සහ අධ්‍යාපනඥයන් විසින් විධිමත් පාසල් අධ්‍යාපනයට සාපේක්ෂ ව සංජානනය කරන ආකාරය යන මැයෙන් සමීක්ෂණ පර්යේෂණ ක්‍රමවේදය පාදක ව සිදු කරන ලද අධ්‍යයනය යි. සිසුන්ගේ පෞද්ගලික පන්ති ඉගෙනුමට බලපා ඇති පාසල හා සබැඳි සාධක සහ එම සාධක පිළිබඳ ව සිසු, ගුරු, විදුහල්පති සහ අධ්‍යාපනඥයින්ගේ සංජානන හඳුනා ගැනීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිසරය, විෂය ධාරා සහ භූගෝලීය පරිසරය නියෝජනය වන අයුරින් සමානුපාතික ස්තරගත අහඹු නියැදියක ගෙන් ආකල්ප පරිමාණ, ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා වශයෙන් වූ බහුවිධ ප්‍රවේශ අනුගමනය කර රැස් කර ගත් දත්ත ඇසුරින් නිගමනවලට එළඹ ඇත.

දෙවැන්න හේවාපතිරණ සහ විතානගේ (2005) දී අ.පො.ස. (උ.පෙ.) විභාගය සඳහා සිසුන් පෞද්ගලික අධ්‍යාපනයට යොමු වීම හා සබැඳි සාධක හඳුනා ගැනීම යන අධ්‍යයනය යි. උසස් පෙළ විෂයයන් සඳහා පුද්ගලික උපකාරක පන්ති අධ්‍යාපනය ලබා ගැනීම සඳහා සිසුන්ට බලපාන සාධක අතර අන්තර්ක්‍රියා ගවේෂණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි. අධ්‍යයනයේ නියැදිය ලෙස කැළණිය විශ්ව විද්‍යාලයේ භෞතීය විද්‍යා විෂය ධාරාවට ඇතුළත් වූ සිසුන් 312 දෙනෙක් යොදා ගෙන ඇත. ප්‍රශ්නාවලි සමීක්ෂණයක් මඟින් මෙම අධ්‍යයනයේ දත්ත එක්රැස් කරන ලදී. උසස් පෙළ විෂයයන් සඳහා පුද්ගලික උපකාරක පන්ති අධ්‍යාපනය ලැබීමට සිසුන්ට බලපාන සාධක වන අතිරේක දැනුම ලබා ගැනීම, මිතුරන් සමඟ ඇසුරු කිරීම, සමස්ත විෂය නිර්දේශය ආවරණය කිරීම, දෙමාපියන්ගේ බලපෑම, දේශීය විශ්ව විද්‍යාලයකට ඇතුළත් වීමට ඇති දැඩි තරඟකාරිත්වය, ගුරුවරයාගේ ආකර්ශනීය ඉගැන්වීමේ රටාව සහ පෙම්වතා / පෙම්වතා හෝ මිතුරන් සමඟ ඇසුරු කිරීම මෙම අධ්‍යයනයේ විචල්‍යයන් ලෙස යොදා ගෙන ඇත. පියර්සන්ගේ කයි වර්ග පරීක්ෂණයෙන් (Pearson's chi-square test) විචල්‍ය බලපෑම තක්සේරු කර ඇත.

තෙවැන්න ශ්‍රී ලංකාවේ සාක්ෂි පදනම් කර ගෙන නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ පෞද්ගලික උපකාරක අධ්‍යාපනය සඳහා වන ඉල්ලුම යන මැයෙන්

පල්ලෙගෙදර (2011) කරන ලද අධ්‍යයනය යි. මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත්තේ ශ්‍රී ලංකාවේ පෞද්ගලික උපකාරක අධ්‍යාපන වියදමට බලපානු ලබන තීරකයන් විමර්ශනය කිරීමයි. මේ සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහස්ථ ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණ 2006/2007 සහ 1995/1996 වර්ෂවල දත්ත සංසන්දනාත්මක ව යොදා ගෙන ඇත. අධ්‍යයනයට අවුරුදු 6 -21 අතර වූ සිසුන් නියැදියක් යොදා ගෙන ඇත. ළමුන්ගේ අධ්‍යාපනයට පෞද්ගලික උපකාරක පන්තිවලට ඇති ඉල්ලුම සමීක්ෂණයෙන් විමසීමට ලක් කර ඇත. එසේ ම මෙහි දී ළමුන්ගේ අධ්‍යාපන වියදම් පිළිබඳ සවිස්තරාත්මක දත්ත රැස්කර ඇත. දත්ත විස්තරාත්මක සහ ආර්ථිකමිතික යන දෙයාකාරයෙන්ම දත්ත විශ්ලේෂණය කර ඇත.

සිවුවැන්න ගොබිගා (Gobiga, 2017) විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ කලවංචිකුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය බල ප්‍රදේශයේ සිසුන් පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට යොමු වීමේ නැඹුරුව හා සබැඳි දෙමාපිය සංජානනය පිළිබඳ ව අධ්‍යයනය යි. එහි ප්‍රධාන අරමුණ සිසුන් පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට යොමු වීම හා සබැඳි දෙමාපිය සංජානනය විමර්ශනය කිරීම විය. අධ්‍යයනයේ දී සිය දරුවන් පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට යොමු කිරීමෙහි ලා දෙමාපිය පෙලඹුමක් ඇති කිරීමට බලපා ඇති සාධක හඳුනා ගැනීම, සිය දරුවන් උදෙසා පෞද්ගලික උපකාරක අධ්‍යාපනයේ ඇති අවශ්‍යතාව හා සබැඳි දෙමාපිය සංජානන, පෞද්ගලික උපකාරක පන්තිවල සිය දරුවන්ගේ ඉගෙනුම එම පෞද්ගලික පන්තිවල පහසුකම් මෙන් ම පෞද්ගලික උපකාරක පන්තිවල තම දරුවන්ගේ ඉගෙනුම හා සබැඳි දෙමාපිය සහභාගිත්වය හඳුනා ගැනීම යන සුවිශේෂී ඉලක්ක පාදක ව ඇත. පර්යේෂණ නියැදිය 2015/2016 සංඛ්‍යාලේඛන වාර්ෂික සංග්‍රහය පාදක කර ගනිමින් කලවංචිකුඩි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පාසල් සිසුන්ගේ දෙමාපියන් 100ක් අහඹු ලෙස තෝරා ගැනුණි. පෞද්ගලික උපකාරක අධ්‍යාපනයේ වැදගත්කම, පෞද්ගලික උපකාරක පන්තිවල ඉගෙනුම, ඒවායේ පහසුකම් සහ පෞද්ගලික උපකාරක පන්තිවල සිය දරුවන්ගේ ඉගෙනුම සඳහා වන දෙමාපිය සහභාගිත්වය යන විචල්‍ය පරීක්ෂාවට ලක් කර ඇත.

පස්වැන්න දමයන්ති (2018) විසින් ශ්‍රී ලංකාවේ සිසුන් පෞද්ගලික පන්ති අධ්‍යාපනය සඳහා යොමු වීමෙහි ලා වන සමාජ ආර්ථික මුහුණුවර යන අධ්‍යයනය යි.

පෞද්ගලික පන්ති අධ්‍යාපනය සඳහා වන ඉල්ලුමට බලපා ඇති සාධක අනාවරණය කර ගැනීම ප්‍රධාන අරමුණ වූ මෙම අධ්‍යයනය කොළඹ, කළුතර, ගාල්ල, මාතර දිස්ත්‍රික්කවලින් තෝරා ගන්නා ලද 1C වර්ගයේ පාසල්වල 785ක ශිෂ්‍ය නියැදියක් ඇසුරින් ක්‍රියාත්මක ව ඇත. සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලී පාදක ව සමීක්ෂණ පර්යේෂණ ප්‍රවේශය මගින් සතිපතා සහභාගි වන සහ ගත කරනු ලබන පෞද්ගලික උපකාරක අධ්‍යාපන පැය ගණන, ගෘහස්ථ පිරිවැය, ශිෂ්‍ය වයස හා ස්ත්‍රී පුරුෂ බව, දෙමාපිය සහාය, දෙමාපිය ගුරු සබඳතා යන විචල්‍ය පරීක්ෂාවට ලක් කර ඇත

හයවැන්න සිල්වා (1994) විසින් ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් සහිත ව ආසියානු කලාපයේ පාසලින් බැහැර ව ක්‍රියාත්මක වන අධ්‍යාපනය මැයෙන් පර්යේෂණාශ්‍රිත ලේඛන විශ්ලේෂණ පර්යේෂණය යි. ලංකාව සුවිශේෂි ව අවධානය යොමු කරමින් ආසියානු කලාපිය රටවල ක්‍රියාත්මක වන පාසලින් බැහැර ව පෞද්ගලික උපකාරක අධ්‍යාපනයේ ස්වභාවය හඳුනා ගැනීම අරමුණු සහිත ව මෙම අධ්‍යයනය ක්‍රියාත්මක ව ඇත. රාජසිංගම්ගේ (1980) ශ්‍රී ලංකාවේ යාපනය නාගරික බල ප්‍රදේශයේ පෞද්ගලික උපකාරක අධ්‍යාපනයේ වර්ධනය සහ සංවර්ධනය ද, හේමචන්ද්‍රගේ (1982) පෞද්ගලික උපකාරක පන්තිවල වර්ධනය සහ සංවර්ධනය ඒ කෙරෙහි බලපා ඇති සමාජීය සාධක නම්වූ පර්යේෂණාශ්‍රිත ලේඛන දෙක විශ්ලේෂණයෙන් මෙම අධ්‍යයනය සිදු කර ඇත.

හත්වැන්න ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2012) විසින් පාසල් සිසුන් පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගි වීම පිළිබඳ අධ්‍යයනය යි. ප්‍රාථමික අධ්‍යාපනයේ සිට තෘතීය මට්ටම දක්වා වූ පාසල් අධ්‍යාපනයට පරිබාහිර ව ක්‍රියාත්මක වන උපකාරක පන්ති ජාලයේ ශීඝ්‍ර ව්‍යාප්තිය හා සබැඳි විවිධ පැතිකඩ විමර්ශනය කිරීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විණි. ප්‍රධාන අරමුණ ඔස්සේ පරීක්ෂාවට ලක් කරන ලද සුවිශේෂී අරමුණු 06කි. එනම් පාසල් සිසුන් පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගී වීමේ වර්තමාන ස්වභාවය, සිසුන්ගේ උපකාරක පන්තිවලට සහභාගීත්ව රටා, උපකාරක පන්තිවලට යොමු වීමට බලපා ඇති සාධක, පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගි වීමෙන් පාසලේ පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති වන බලපෑම සහ පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගීවීමෙන් සිසුන්ට සිදුවන වාසි අවාසි සහ ඒ ආශ්‍රිත ව වන සමාජ ගැටලු විමසීම ය. සමීක්ෂණ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ස්තරගත අහඹු

නියැදිකරණය යොදා ගනිමින් තෝරා ගන්නා ලද, සිසුන්, ගුරු, දෙමාපිය, විදුහල්පති, විද්වතුන්, පෞද්ගලික සංගම් වශයෙන් වූ නියැදියකින් ප්‍රතිචාර ලබා ගැණිනි. පෞද්ගලික උපකාරක පන්ති හා සබැඳි විවිධ වාර්තා, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, ශිල්ප ක්‍රම ඇසුරින් ලබා ගත් දත්ත විශ්ලේෂණයෙන් අනාවරණ සහ නිගමන ඉදිරිපත් කර ඇත

අටවැන්න අතුකෝරළ (2020) විසින් පෞද්ගලික උපකාරක අධ්‍යාපනයේ අහිතකර බලපෑම් යන මැයෙන් පවත්වන ලද අධ්‍යයනය යි. ශිෂ්‍ය ජනගහනයේ පුම්තිරිබව, ආදායම් කාණ්ඩය, විෂය ධාරා සහ විෂය අනුව පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට සහභාගි වන ප්‍රතිශත සෙවීම, පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට දරනු ලබන වියදම□ ගෘහස්ත ආදායම සහ වියදම් රටා සමග සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීම, පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට ශිෂ්‍යයාගේ සාධනයට වන ධනාත්මක බලපෑම තක්සේරු කිරීම, පෞද්ගලික උපකාරක අධ්‍යාපනයෙන් ළමයාට, ගෘහස්ත ඒකකවලට සහ පාසලට වන හානිකර බලපෑම් අධ්‍යයනය කිරීම සහ පෞද්ගලික උපකාරක අධ්‍යාපනයෙන් වන හානිකර බලපෑම් අවම කිරීම පිණිස ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ පිරිසැලසුම භාවිත කර ඇත. දත්ත රැස්කිරීමේ ක්‍රමවේද ලෙස පවතින ද්විතීයික දත්ත විශ්ලේෂණය, සිසුන්ට සහ ගුරුවරුන්ට ප්‍රශ්නාවලි ලබා දීම සහ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම යොදා ගෙන ඇත. අධ්‍යයනයේ නියැදිය ලෙස නාගරික, ග්‍රාමීය සහ වතු ආශ්‍රිත ප්‍රදේශ මෙන්ම ජනවර්ග, පුම්තිරිබව, පාසල් වර්ග, විෂයධාරා සහ ආර්ථික මට්ටම් නියෝජනය වන පරිදි තෝරා ගෙන ඇත. ලබා ගත් සංඛ්‍යානමය දත්ත ප්‍රමාණාත්මක ව විශ්ලේෂණය කර අනාවරණ ඉදිරිපත් කර ඇත.

## 5.0 පර්යේෂණාශ්‍රිත ලේඛනවලින් ඉදිරිපත් කරන ලද අනාවරණ

විමර්ශනයට ලක් කරන ලද ලේඛන ආශ්‍රයෙන් ඉදිරිපත්ව ඇති අනාවරණ ප්‍රධාන තේමා පහක් යටතේ සංවිධානය කළ හැකි ය.

- අ.පො.ස. (උ.පෙ.) සිසුන් පාසල් පැමිණීම අවම වීම හා සබැඳි අධ්‍යාපන ප්‍රතිපත්තිමය දුර්වලතා
- සිසුන් පාසල් පැමිණීම අවම වීමට බලපානු ලබන පාසල් කළමනාකරණය සහ පරිපාලනමය අඩුපාඩු

- විෂයමාලාව සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා
- අධ්‍යාපනය, පාසල හා සබැඳි දෙමාපිය සහ ශිෂ්‍ය අපේක්ෂණ
- පෞද්ගලික උපකාරක පන්තිවල බලපෑම

එක් එක් තේමා යටතේ ඉදිරිපත්ව ඇති අනාවරණ මතු දැක්වේ.

## 5.1 සිසුන් පාසල් පැමිණීම අවම වීම හා සබැඳි අධ්‍යාපන ප්‍රතිපත්තිමය දුර්වලතා

ජාතික අධ්‍යාපන ආයතනය (2016) අනුව ජාතික ඒකාබද්ධතාව ගරු කරන, පූර්ණ පෞරුෂයකින් යුතු පුද්ගලයකු බිහි කිරීම අපේක්ෂිත වුව ද, දැනුම කේන්ද්‍රීය සහ විභාග කේන්ද්‍රීය විෂයමාලාව, තරඟකාරී අධ්‍යාපනය, ප්‍රජානන ශක්තීන් පමණක් මැනෙන විභාග ක්‍රමය උසස් අධ්‍යාපනයේ සීමිත අවස්ථා සහිත ප්‍රවේශයකට සිසුන් යොමු කිරීම ද ගැටලුසහගත ය. උසස්පෙළ අධ්‍යාපනය අවසන් කරන සිසුන්ට උසස් අධ්‍යාපන අවස්ථා ප්‍රසාරණය කිරීම අවශ්‍ය වන අතර විෂය ධාරා තෝරා ගැනීම සම්බන්ධ විධිමත් වැඩ පිළිවෙළක්, වෘත්තීය මෙන් ම අධ්‍යාපනික මාර්ගෝපදේශන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොවේ. දෛනික කාලසටහන උසස්පෙළ විෂය නිපුණතා සංවර්ධනයට නොගැළපෙන බව දක්වා ඇත.

අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය (2019) අනුව අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටීමෙන් පසුව අ.පො.ස. (උ.පෙ.) ආරම්භවීම දක්වා වූ කාලය ශිෂ්‍යයා සම්බන්ධ ව නිශ්චිත ක්‍රමවේදයක් ජාතික මට්ටමින් ක්‍රියාත්මක නොවේ. කොඩිතුවක්කු (1992) අනුව විෂයමාලා සම්පාදකයින් අපේක්ෂිත මට්ටමත් පාසල්වල ක්‍රියාත්මක මට්ටමත් අතර පරස්පරතාවක් පවතී. උස්ගොඩ ආරච්චි (2020) දක්වා ඇත්තේ උසස් පෙළ විෂය ධාරා හැදෑරීම සඳහා සිසුන් බඳවා ගැනීමේ දී අනුගමනය කළ යුතු 2008/17 චක්‍රලේඛයේ සඳහන් නිර්ණායක ප්‍රමාණවත් නොවන බව යි.

## 5.2 සිසුන් පාසල් පැමිණීම අවම වීමට බලපානු ලබන පාසල් කළමනාකරණය සහ පරිපාලනමය අඩුපාඩු

අන්ද්‍රාහැන්නදි සහ සෙසු අයගේ (2019) අධ්‍යයනයට අනුව 12--13 ශ්‍රේණිවල සිසුන් අ.පො.ස. (උ.පෙ.) විභාගයට පෙනී සිටීමේ දී විභාගය අයදුම් කරන අවස්ථාව වන

විට 80%ක පැමිණීම සපුරා තිබිය යුතු බවට 2006/45 චක්‍රලේඛ උපදෙස් ලබා දී තිබුණ ද, එම විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී නියමිත පරිදි සිදු නො වන බව දක්වා ඇත. නිදසුන් ලෙස විභාගය අයදුම් කරන අවස්ථාවේ දී 80% පැමිණීම පාසල් මට්ටමින් පරීක්ෂාවට ලක් කර 80%ක පැමිණීම සපුරා ඇති සිසුන්ට පමණක් විභාගයට ඉල්ලුම් කිරීමට ඉඩ සලසා ඇති නමුත් ඇතැම් අවස්ථාවල එම අවශ්‍යතාව සපුරා නොමැති සිසුන් කලාප අධ්‍යාපන බලධාරීන් වෙත විවිධ හේතු දක්වමින් අභියාචනා ඉදිරිපත් කර විභාගයට පෙනී සිටීමට අවස්ථා ලබා ගන්නා බව ද අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය (2019) දක්වා ඇත. එසේම චක්‍රලේඛය ක්‍රියාත්මක වන පාසල් මෙන්ම චක්‍රලේඛය ක්‍රියාත්මක නොකරන පාසල් ද පවතින බව අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය (2019) නිරීක්ෂණය කර ඇත. චක්‍රලේඛයේ දක්වන පරිදි උසස් පෙළ පන්තිවල ගුරු ඌනතාවක් පවතී නම් අදාළ බලධාරීන් දැනුවත් කර පිළියම් යෙදිය යුතුය. තව ද පාසලේ ඉගැන්වීම් කරන කාලයේ දී විධිමත් ලෙස හා පිළිගත හැකි හේතු මත නිවාඩු ලබා ගෙන හෝ නොගෙන පෞද්ගලික අපකාරක පන්තිවල ඉගැන්වීමේ යෙදෙන ගුරුවරුන්ට සහ එවැනි ගුරුවරුන් සේවය කරනු ලබන පාසල්වල විදුහල්පතිවරුන්ට එරෙහිව ද විනය පියවර ගන්නා බව දක්වා ඇතත් එම කරුණු ප්‍රායෝගික ව ක්‍රියාත්මක නොවන අවස්ථා අන්ද්‍රාහැන්නදි සහ සෙසු අයට (2019) නිරීක්ෂණය වී ඇත. මේ හේතුවෙන් සිසුන්ගේ පාසල් පැමිණීමේ අවම ප්‍රතිශතය 80% පවත්වා ගෙන යාමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ සීමා පවතින බව අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය (2019) දක්වා ඇත.

## 5.3 විෂයමාලාව සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා

අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය (2019) ට අනුව සිසුන්ගේ පාසල් පැමිණීම අවම වීම අදාළ විෂය නිර්දේශ ආවරණය කිරීමේ දී දුෂ්කරතා ඇති කරන බැවින් විෂය නිර්දේශ ආවරණය නොවන පරිසරයක සිසුන්ගේ පැමිණීම තවදුරටත් අවම වේ. ශිෂ්‍ය නොපැමිණීම නිසා විෂය නිර්දේශ ආවරණය කළ නොහැකි වීම සහ විෂය නිර්දේශ ආවරණය නොවීම නිසා ශිෂ්‍ය පැමිණීමේ මට්ටම තවදුරටත් අවම වීම චක්‍රීය ක්‍රියාවලියක් ලෙසින් ක්‍රියාත්මක වේ. ගුරුවරයාගේ ඉගැන්වීම් රටාවේ ඒකාකාරී බව, ගුරුවරයා නව දැනුම පරිශීලනය නොකිරීම සහ ශිෂ්‍ය නොපැමිණීම අතර ඍජු සම්බන්ධතාවක් පවතින බව අන්ද්‍රාහැන්නදි සහ සෙසු අයට (2019) නිරීක්ෂණය වී ඇත. එසේම ඔවුන් දක්වන පරිදි පාසල්වල ක්‍රියාත්මක විෂය බාහිර

විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් විෂය නිර්දේශ ඉගැන්වීමට වෙන් කර ඇති කාලය ප්‍රමාණවත් නොවීම ද ගැටලු බව යි.

ජාතික අධ්‍යාපන ආයතනය (2016) අනුව විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයාගේ විෂය දැනුම, ඉගැන්වීම් ශෛලිය, ගුරු සිසු සබඳතා ප්‍රබල සාධක වේ පාසලේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ අවිධිමත්භාවය සහ සිසුන්ගේ පාසල් නොපැමිණීම අතර සහසම්බන්ධතාවක් පවතී. පාසලේ ඉගෙනුමට වෙන් කරන ලද කාලයෙන් වැඩි කොටසක් පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා කැප කිරීමට සිදු ව ඇත. පාසලේ ගුරුවරුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ශණීය නොවීම, විෂය නිර්දේශ නිසි පරිදි ආවරණය නොකිරීම මෙන් ම විභාගයට මුහුණ දීම සඳහා ආත්ම විශ්වාසය ඇති නොවීම පාසල් පැමිණීම අවම වීමට හේතු වී ඇත. විෂය නිර්දේශ පුළුල් වීම නිසා පාසලේ ඉගැන්වීම ප්‍රමාණවත් නොවීම ද දක්වා ඇත.
කොඩිතුවක්කු (1992) ට අනුව ශිෂ්‍ය කේන්ද්‍රීය නොවන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම, පුනරීක්ෂණ අභ්‍යාස, විභාග ඉලක්ක ඉගි ඉදිරිපත් නොවීම, දැනුම තහවුරු කිරීම හා සබැඳි මාර්ගෝපදේශ ඉදිරිපත් නොකිරීම, සටහන් පමණක් දීම, පාඩමට පෙර සූදානමක් නොවීම, ගුරු පාර්ශවයෙන් ශිෂ්‍ය පැමිණීම අවම වීමට බලපා ඇති අවධානයට යොමු විය යුතු අනාවරණ වේ. එසේම පල්ලෙගෙදර (2011) අනුව පාසල්වල සම්පත් හිඟකම මෙන් සිසුන්ගේ පාසල් පැමිණීම සීමා කරන සාධකයකි.

Abeywickrama (2008) ට අනුව උසස් පෙළ සාමාන්‍ය ඉංග්‍රීසි පෙළ පොත විවිධ මට්ටම්වල සිටින ඉගෙනුම්ලාභීන්ගේ නිපුණතා ආමන්ත්‍රණය වන පරිදි යොදා ගැනීම දුෂ්කර වී ඇත. එබැවින් මෙම පෙළ පොතෙහි ව්‍යාකරණ, කථනය සහ ලිවීම යන අංශ සඳහා වූ බර තැබීම අඩු කිරීමටත්, එහි පෙනුම සහ ප්‍රමාණය වෙනස් කිරීමටත්, සරල වචන මාලාවක් භාවිත කිරීමටත්, ඉගෙනුම්ලාභීන්ගේ පොදු අවශ්‍යතාවලට අනුකූලව වන පරිදි සරල කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු කළ යුතු බවටත් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

## 5.4 අධ්‍යාපනය, පාසල හා සබැඳි දෙමාපිය සහ ශිෂ්‍ය අපේක්ෂණ

ඒකනායක හා සෙසු අයට (2012) අනුව ප්‍රජාව තම දරුවන් පාසලට එවීමට පෙලඹෙනුයේ සිසුන්ගේ සාධන මට්ටම සම්බන්ධ පාසල ගොඩ නගා ගෙන ඇති

ප්‍රතිරූපය පිළිබඳ ව සෑහීමකට පත් වුවහොත් පමණි. උසස් අධ්‍යාපනයට පිවිසීම සඳහා වන දැඩි තරඟකාරී බව ජය ගැනීමේ වඩාත් ඵලදායී මාර්ගය ලෙසට පෞද්ගලික පන්ති අධ්‍යාපනය තෝරා ගැනීමට ලැබෙන්නා වූ දෙමාපිය අනුබලය සිසුන් පාසල වෙනුවට විකල්ප අධ්‍යාපන අවස්ථාවලට යොමු වීමෙන් පාසල් පැමිණීම අවම වීමට බලපා ඇත. දෙමාපිය අපේක්ෂා ශිෂ්‍ය සාධනය අතර ඉතා ප්‍රබල සබඳතාවක් පවතී (Fan සහ Chen, 2001). ගොබිගා (Gobiga, 2017) අනුව බොහෝ දෙමාපියන් පුද්ගලික පන්තිවලින් ඉගෙනුම ලැබීමට දරණ පිරිවැය උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීම සහ ඉහළ වැටුපක් සහිත රැකියාවක් සඳහා කරන ආයෝජනයක් සේ පිළිගනී.

## 5.5 පෞද්ගලික උපකාරක පන්තිවල බලපෑම

ජාතික අධ්‍යාපන ආයතනය (2016) අනාවරණ අනුව අනෙකුත් අධ්‍යාපන මට්ටම්වලට වඩා අ.පො.ස. (උ.පෙ.) අවධියේ දී ඇති තරඟකාරී බව නිසා විකල්ප අධ්‍යාපනයක් ලෙස පෞද්ගලික උපකාරක පන්තිවලට සිසුන් යොමු වී ඇත. දමයන්ති (2018) ට අනුව පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට යොමු වීමෙහි ලා පාසලේ ඉගැන්වීම ප්‍රමාණවත් නොවීම, විභාගය සඳහා සූදානම, පාසලේ උගන්වන දෑ තේරුම් ගැනීමේ දුෂ්කරතා, තම දරුවන්ට සහාය වීමට දෙමාපියන්ට කාලය නොමැති වීම මෙන් ම නොදැනුවත් බව පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට යොමු වන බවට ශිෂ්‍ය - දෙමාපිය දෙපාර්ශවය ම පිළිගෙන ඇත. මෙම අධ්‍යයනයේ දී පෞද්ගලික උපකාරක අධ්‍යාපනයට දරුවන් යොමු කිරීමෙන් ශිෂ්‍ය සාධනය වර්ධනයට අවස්ථාව උදාවන බවට පාසල් ගුරුවරුන් විසින් දෙමාපියන්ට උපදෙස් දීම, අවධානයට යොමු විය යුතු අනාවරණයකි. තම දරුවන්ට වඩා පහසුකම් සහිත පෞද්ගලික උපකාරක අධ්‍යාපනයක් ලබා දෙනු පිණිස ධනවත් දෙමාපියන් විසින් විශාල වියදමක් දරණු ලබන නමුත් දිළිඳු දෙමාපියන්ගේ දරුවන්ට මුහුණ දීමට ඇත්තේ ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකට ය. පෞද්ගලික අධ්‍යාපනයට දරණු ලබන මෙම අසමාන ආයෝජනය හේතුවෙන් රටේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියේ මූලික පරමාර්ථවලට පටහැනි තත්ත්වයක් නිර්මාණය වී ඇත. මේ නිසා අවාසි සහගත තත්ත්වයට මුහුණ දී ඇති සිසුන් වෙනුවෙන් අතිරේක කාලයක් සහ සම්පත් යොදා ගනිමින් මැදිහත් වීමේ අවශ්‍යතාව ජනිත වන්නේ පෞද්ගලික උපකාරක අධ්‍යාපනයේ ප්‍රධාන භූමිකාව දරනුයේ පාසල් ගුරුවරුන් වන බැවිනි. නිදහස්

අධ්‍යාපන ප්‍රතිපත්තිය ගුණාත්මක මට්ටමකින් ඉහළ නැංවීමෙහි ලා ගුරුවරුන්ගේ ඵලදායිතාව වර්ධනය කිරීමේ වැඩපිළිවෙළක අවශ්‍යතාව පවතී.

අන්ද්‍රාහැන්නදි සහ සෙසු අයගේ (2019) අධ්‍යයනයට අනුව පාසල පැවැත්වෙන දිනවල උදය වරුවේ පෞද්ගලික පන්ති පැවැත්වීම, සිසුන්ගේ පාසල් පැමිණීම අවම වීමට හේතුවකි. පාසල් පද්ධතිය අ.පො.ස. (උ.පෙ.) පන්ති ඇරඹීමට පෙර පෞද්ගලික පන්ති සිය ඉගැන්වීම ආරම්භ කිරීම සිසුන් ඒ කෙරෙහි යොමු කිරීමට බලපා ඇත. ආකර්ශනීය ඉගැන්වීම් ක්‍රම, තාක්ෂණික මෙවලම් භාවිතය සහ අත්පත්‍රිකා නිබන්ධන සැපයීම පෞද්ගලික උපකාරක පන්තිවලට සිසුන් ආකර්ශනය කර ගැනීමට සමත්ව ඇත. කොඩිතුවක්කු (1992) අනුව පෞද්ගලික පන්ති මගින් ආරම්භයේ සිට විභාගය ඉලක්ක කර ගෙන ඉගැන්වීම, විභාගයට අදාළ ඉලක්ක, ඉඟි ලබා දීම, පුනරීක්ෂණ අභ්‍යාස හා සැසි මෙහෙයවීම වැනි ක්‍රම ශිල්ප 13 වන ශ්‍රේණියේ දී සිසුන් පාසලින් ඈත් කරමින් පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු කර ඇත. ඒ අනුව සිසුන්ගේ 93%ක් පෞද්ගලික උපකාරක පන්ති අධ්‍යාපනයට යොමු වී ඇත. විෂයධාරා වශයෙන් සැලකීමේ දී විද්‍යා සහ වාණිජ විෂයධාරා හදාරණ සිසුන් බහුතරයක් පෞද්ගලික අධ්‍යාපනයට යොමු ව ඇත. ගම්බදට වඩා නාගරික සිසුන් පෞද්ගලික අධ්‍යාපනයට යොමු වීමේ ප්‍රවණතාවක් පවතී. විෂය නිර්දේශය සම්පූර්ණ නොකිරීම, ක්‍රියාකාරකම් සහිත නිබන්ධන ලබා නොදීම, සටහන් ආශ්‍රිත ව පමණක් වන ඉගැන්වීමේ ක්‍රමවේද, විභාගය ඉලක්ක කර ගැනීමෙන් තොර ව වන ඉගැන්වීම යන සාධක සිසුන් පෞද්ගලික පන්ති කෙරෙහි යොමු වීමට බලපෑ පාසල හා සබැඳි ප්‍රධාන විචල්‍ය වේ. එමෙන් ම පාසලින් ලබා දෙන ලද දැනුම ප්‍රමාණවත් බවට වන විශ්වාසය ඇති කිරීමට පාසල අසමත් වීම, සිසුන්ට උපරිම ප්‍රයෝජන ලැබෙන සේ පාසල කළමනාකරණය නොවීම මෙන් ම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රියාවලිය ගුණාත්මක බවින් අඩු වීම, සිසුන් පෞද්ගලික පන්ති කරා යාමට බලපා ඇත (කොඩිතුවක්කු, 1992).

ජාතික අධ්‍යාපන ආයතනය (2016) මගින් සිදු කරන ලද අධ්‍යයනයේ අනාවරණ අනුව කලා විෂය ධාරාව හදාරන සිසුන්ට වඩා විද්‍යා / ගණිත, වාණිජ විෂයධාරා හදාරන සිසුන් පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු ව ඇත. ගම්බද සිසුන්ට වඩා නාගරික සිසුන් ද පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු වීම කැපී පෙනේ. සිල්වා (1994) විසින් සිදු කරන ලද පර්යේෂණාශ්‍රිත ලේඛන විශ්ලේෂණ අනාවරණ

අනුව ශ්‍රී ලංකාවේ පෞද්ගලික උපකාරක පන්ති විවිධ මට්ටමෙන් පවතී. ඒවා කේවල, කුඩා කණ්ඩායම්, පොදු හා විශාල කණ්ඩායම් වශයෙන් මෙන් ම තනි ගුරුවරයෙකු මෙන් ම ආයතනයක් මගින් මෙහෙයවන පන්ති වශයෙන් විවිධ පරාසයක පවතී. සතියේ දිනවල පෙරවරුවේ මෙන් ම පස්වරුවේ ද, සන්ධ්‍යා කාලයේ ද එහි ආරම්භයේ ද වශයෙන් විවිධ වේලාවන් අනුව ක්‍රියාත්මක වේ.

පල්ලෙගෙදර (2011) අනාවරණය කරනුයේ 1995/96 වර්ෂයේ දී සිසුන් සිය පෞද්ගලික උපකාරක අධ්‍යාපනය සඳහා පවුලේ ආදායමෙන් 23.26%ක ප්‍රතිශතයක් වියදම් කිරීමේ වූ හැකියාව 2006/2007 දී 63.67% දක්වා වර්ධනය වී ඇති ආකාරයයි. මේ අනුව ගෘහස්ථ ආදායමෙන් සැලකිය යුතු කොටසක් පෞද්ගලික උපකාරක පන්ති සඳහා වැය කිරීමට සිදුවීම නිදහස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීමෙහි ලා අභියෝගාත්මක බලපෑමක් කර ඇති බව ය. දෙමාපිය සමාජ ආර්ථික මට්ටම ශිෂ්‍යයා ලබන පෞද්ගලික උපකාරක පන්ති අධ්‍යාපනය අතර මනා සම්බන්ධතාවක් පවතී. ගෘහස්ථ පිරිවැයෙන් කරනු ලබන වැය කිරීම් අතර 1995/96 වර්ෂයේ දී එය සුඛෝපභෝගී සේවාවක් සඳහා වන වියදමක් ලෙස පිළිගැනුන ද, 2006/2007 වන අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් ව ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට (2012) අනුව 10 ශ්‍රේණියේ සිට ඉහළට පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු වීම ඉහළ ප්‍රතිශත අගයක පවතී. පොදු උපකාරක පන්තිවලට යොමු වීමේ ප්‍රවණතාව කැපී පෙනේ. සාපේක්ෂ වශයෙන් අ.පො.ස. (උ.පෙ.) සිසුන් වැඩි කාලයක් පෞද්ගලික පන්තිවලට සහභාගි වන අතර ම එහි උගන්වන ගුරුවරුන් වැඩි ප්‍රමාණයක් රජයේ පාසල්වල සේවය නොකරන අය වීම විශේෂිත ය. විෂයධාරා අනුව උසස් පෙළ විද්‍යාව, ගණිත විෂයධාරා සිසුන් පෞද්ගලික පන්ති සඳහා දරණ පිරිවැය ඉහළ මට්ටමක පවතී. උසස් පෙළ සිසුන් පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගිවීමෙහි ලා විෂය කරුණු වඩා හොඳින් අවබෝධ වීම, දැනුම වැඩි කර ගැනීම, විභාග ඉලක්ක කර ගැනීම, අනුමාන ප්‍රශ්න ලබා දීම සහ විෂය නිර්දේශයට වඩා කරුණු ලබා දීම යන සාධක ප්‍රමුඛ වේ. පුද්ගලික උපකාරක පන්තිවලට සහභාගි වීමේ දී 13 වන ශ්‍රේණියේ දෙවන, තෙවන වාරවල දී බහුතරයක් වූ ශිෂ්‍ය නොපැමිණීම පාසලේ සම්පත් නාස්තියකි. එමගින් පාසල පිළිබඳ ව මෙන් ම ගුරුවරුන් පිළිබඳව වූ පිළිගැනීම අභියෝගයට ලක් ව ඇත. උපකාරක පන්තිවලට සහභාගි වන සිසුන් වාසි මෙන් ම අවාසිදායක

තත්ත්වයන්ට මුහුණපාන අතර ම සමාජ ගැටලුවලට ද හේතු වේ. උපකාරක පන්ති ක්‍රියාවලිය ඉහළ සමාජ පිළිගැනීමට ලක් ව ඇත. පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සබැඳි අඩුපාඩු පරිපාලන වශයෙන් වන ගැටලු විසඳීමේ අවශ්‍යතාව පවතී. ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ, පළාත් අමාත්‍යාංශ, පාසල් මට්ටමින් මෙන් ම විෂයමාලා සම්පාදන ක්‍රියාවලිය නැවත විමර්ශනයට ලක් කළ යුතු අතර අධ්‍යාපන ක්‍රියාවලිය හා සබැඳි ඍජු මෙන් ම වක්‍ර පාර්ශවකරුවන්ගේ සමෝධානිත මැදිහත්වීමක අවශ්‍යතාව පවතී.

ගුණසේකර (2007) පෙන්වා දී ඇති පරිදි දිස්ත්‍රික්ක අනුව, පාසලේ පිහිටීම (නගරබද/ගම්බද) අනුව, පාසල් වර්ගය (1AB/1C) අනුව, විෂයධාරා අනුව, භාෂා මාධ්‍ය අනුව සිසුන්ගේ පැමිණීමේ රටා අතර විවිධතා ප්‍රදර්ශනය වූ නමුත් පාසල පැවැත්වෙන දින ගණනින් 80%ක් පාසල් පැමිණීම එම කිසිවකු විසින් සපුරා නැති බව අනාවරණය වී ඇත. විභාගය උසස් ලෙස සමත්වීම උදෙසා පාසල් අධ්‍යාපනයට වඩා පුද්ගලික අධ්‍යාපනය ප්‍රබල වේ යයි පවතින විශ්වාසය හේතුවෙන් 12 වන ශ්‍රේණියට සාපේක්ෂ ව 13 වන ශ්‍රේණියේ දී පාසල් පැමිණීම අවම මට්ටමකට පත් ව ඇත. පාසල්වල සිසුන්ට උසස් පෙළ විෂය ධාරා තෝරා ගැනීම සහ ඉගෙනුම් ගැටලු විසඳා ගැනීම සඳහා වන මාර්ගෝපදේශ සේවාවක අවශ්‍යතාව පවතී. උසස් පෙළ විෂය ධාරා විවිධාංගීකරණය ඉගැන්වීම් ක්‍රියාවලිය හා සබැඳි ගුරු වගකීම් පිළිබඳ ව දැනුම්වත් කිරීම, ශිෂ්‍ය පැමිණීම වර්ධනය කිරීමේ ක්‍රමවේද නියාමනය කිරීමේ ක්‍රමවේද සැකසීමේ අවශ්‍යවතාව පවතී.

## 6.0 අධ්‍යයන අනාවරණ ඇසුරින් අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් පැමිණීම වර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්දේශිත පියවර

උක්ත අධ්‍යයනවලින් අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් පැමිණීම වර්ධනය කිරීම සම්බන්ධ ව ඉදිරිපත් ව ඇති නිර්දේශ සහ යෝජනා විමර්ශනයෙන් එළඹි නිර්දේශ පහත සඳහන් තේමා ඔස්සේ ඉදිරිපත් කෙරේ.

## 6.1 ප්‍රතිපත්තිමය තීරණ

- ජාතික අධ්‍යාපන ආයතනය (2016) නිර්දේශ අනුව අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටීමෙන් පසු ව සහ උසස්පෙළ පන්ති ඇරඹීම දක්වා වූ කාලසීමාව උසස්පෙළ විෂයධාරාවලට ගැළපෙන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාසලට හඳුන්වා දිය යුතුය.
- අ.පො.ස. (උ.පෙ.) විභාගයේ ඇති දැඩි තරඟකාරී බව, උසස් අධ්‍යාපනය හා සෘජු ව සම්බන්ධ වන බැවින් උසස් හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම අවශ්‍ය ය.
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (2012) විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව මගින් අ.පො.ස (සා.පෙළ) සිට ආචාර්ය උපාධිය දක්වා වූ මට්ටම් 10කින් සමන්විත අධ්‍යාපන අවස්ථා හා සමානුරූපී වන සේ අ.පො.ස උසස් පෙළ පාඨමාලාව සැකසිය යුතුය. කොඩිතුවක්කු (1992) අධ්‍යයනයෙන් නිර්දේශිත පියවර අතර අ.පො.ස. (උ.පෙ.) පාඨමාලා විවිධාංගීකරණයක අවශ්‍යතාව පවතී. විෂය අන්තර්ගත ඇගයීම් පටිපාටිය පැහැදිලි ව හඳුනා ගැනීම අවශ්‍ය ය.
- ගුරුවරුන් සඳහා ගුණාත්මක සේවා සැසි සංවිධානය, ඒවාට ගුරුවරුන්ගේ අනිවාර්ය සහභාගීත්වය ද ලබා ගැනීම අවශ්‍ය වන අතර රාජකාරී සහ වෙනත් ගුරු නිවාඩුවල දී විෂය ආවරණය කිරීමේ විකල්ප වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුතු ය.
- ගුරු හිගය මග හැරීම මෙන් ම ඉගෙනුම් ඉගැන්වීම් සම්පත් සම්පාදනය අවශ්‍ය වේ. සිසුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් අධ්‍යාපනයේ විවිධ පාර්ශවකරුවන්ගේ වගකීමේ නීතිමය පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පවතී . ගුරු හිඟය, පාසල් නොපැමිණීමට ප්‍රබල සාධකයක් වන බැවින් ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතු ය (ජාතික අධ්‍යාපන ආයතනය, 2016).
- විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමේ දී පාදක කර ගනු ලබන Z ලකුණ සහ දිස්ත්‍රික් කෝටා ක්‍රමය වර්තමානයට උචිත වන අයුරින් නැවත සමාලෝචනය අවශ්‍ය ය. උසස් පෙළ විෂයමාලා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය භෞතික සම්පත් හා පහසුකම් ලබාදීමේ වැඩ පිළිවෙළක් අවශ්‍ය වේ.

## 6.2 පෞද්ගලික උපකාරක පන්ති නියාමන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

- අන්ද්‍රාහැන්නදි සහ සෙසු අයගේ (2019) අධ්‍යයන නිර්දේශ අනුව උසස් පෙළ සිසුන්ගේ පාසල් නොපැමිණීම සහ පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගී වීම අතර සෘජු සම්බන්ධතාවක් පවතින බැවින් පාසල් කාලය තුළ උපකාරක පන්ති පැවැත්වීම තහනම් කළ යුතු ය.
- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට (2012) අනුව උපකාරක පන්ති ගුරුවරුන් ද පාසල් වේලාව තුළ දී උපකාරක පන්ති පැවැත්වීමෙන් වැළකී සිටිය යුතු අතර, පළාත් සභා මගින් ප්‍රකාශිත අධ්‍යාපන ප්‍රඥප්තිවලට අනුකූල ව කටයුතු කිරීම, තම පන්තිවලට සහභාගී වන සිසුන්ගේ ආරක්ෂාව, විනය පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම, දැනුම මෙන් ම පෞරුෂ සංවර්ධනයෙහි ලා ක්‍රියා කිරීම සහ පාසල් ගුරුවරුන් පිළිබඳ යහපත් ආකල්පයකින් යුතු ව ක්‍රියා කළ යුතු ය.

## 6.3 අ.පො.ස. (උ.පෙ) විභාගය නව තක්සේරු සංස්කෘතියට අනුගත කිරීම

- විධිමත් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ජාතික පොදු අරමුණු, මූලික නිපුණතා මෙන් ම විෂය අරමුණුවලට අනුකූල වන සේ විෂයමාලාව සම්පාදනය කළ යුතු ය. පවත්නා දැඩි තරඟකාරී විෂය කේන්ද්‍රීය ඇගයීම් ක්‍රමයේ වෙනසක් කිරීම අවශ්‍ය වේ (කොඩිතුවක්කු, 1992). ඒ සඳහා තරඟකාරි විභාග රටාව වෙනුවට ප්‍රායෝගික කුසලතා ප්‍රමුඛ කර ගත් තක්සේරුකරණ සංස්කෘතියට පාසල් අධ්‍යාපනය යොමු කළ යුතු ය.
- උසස් පෙළ විෂයමාලාව වෘත්තීය ලෝකය සමග සම්බන්ධ කිරීම දැනට විෂයධාරා වශයෙන් වෙන් කර ඇති උසස්පෙළ විෂයමාලාව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සමග සෘජු ව සම්බන්ධ වන අයුරින් සම්පාදිත වූවකි. වෙනස් වන වෘත්තීය සහ සමාජ අපේක්ෂණවලට උචිත වන සේ විෂයධාරා වර්ගීකරණය, විෂය අන්තර්ගතය ප්‍රායෝගිකත්වයට නැඹුරු වන සේ සැකසීම පිළිබඳ නැවත සමාලෝචනයක් අවශ්‍ය ය.

## 6.4 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- වර්තමානයේ ප්‍රාථමික අවධියේ සහ ද්විතීයික අවධියේ ඇතැම් විෂයවලට පමණක් සීමා වෙමින් ක්‍රියාත්මක වූ ක්‍රියාකාරී ප්‍රබෝධජනක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරුන් සවිබල ගැන්විය යුතුය

(කොඩිතුවක්කු, 1992). මේ සඳහා ගුරු පුහුණු පාඨමාලා, පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් උපයෝගී කර ගත යුතු ය.

- උසස්පෙළ උගන්වන ගුරුවරුන් විෂය ප්‍රවීණතාව තිබුණ ද, ඉගැන්වීමේ ශික්ෂණ විද්‍යාත්මක ප්‍රවේශ හෝ ශිෂ්‍ය ස්වභාවය නිවැරදි ව හඳුනා නොගෙන ඉගැන්වීමට පිවිසීමේ ක්‍රමයේ වෙනසක් කිරීම අවශ්‍ය වේ. උපාධිධාරීන් සඳහා වන සති තුනක පූර්ව උපාධ්‍යයන සේවා පුහුණු වැඩපිළිවෙළ වෙනස් කළ යුතු ය. ආධුනික ගුරුවරුන් සඳහා පාසල් පාදක උපාධ්‍යායවරු මගින් සුසාධ්‍යකරණ වැඩ පිළිවෙළක් පාසලේ ස්ථාපිත කිරීම (අධ්‍යාපන අමාත්‍යාංශය, 2013) සහ ගුරුවරුන්ගේ ශික්ෂණ විද්‍යාත්මක කුසලතා වර්ධනය කිරීම ඉලක්ක කර ගත් ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.
- ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම සම්බන්ධ වැඩ පිළිවෙළක් සංවිධානය කර ක්‍රියාත්මක කළ යුතු ය. උස්ගොඩ ආරච්චි (2020) අනුව ශිෂ්‍යයන් හට විෂයයට අදාළ අතිරේක පොත පත පරිශීලනය කර ස්වයං අධ්‍යනයෙහි යෙදීමට මග පෙන්වා දී සැලසුම් සහගත ව නිපුණතා පාදක ව ශිෂ්‍ය කේන්ද්‍රීය ව මෙන්ම ක්‍රියාකාරකම් අභිමුඛව පාසල් පාදක ඇගයීම් සිදු කිරීමට අවස්ථාව ලබා දීම හා ඒ සඳහා සිසුන් මෙන්ම ගුරුවරුන් අභිප්‍රේරණය වන පරිදි උසස් පෙළ ප්‍රශ්න පත්‍ර අන්තර්ගතය වෙනස් කිරීමෙන් සිසුන් අඛණ්ඩව පාසල් පැමිණීම වර්ධනය කර ගත හැකි වනු ඇත.
- අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය (2019) පෙන්වා දෙන පරිදි උසස් පෙළ ගුරුවරුන් සම්බන්ධ ගුරු උපදේශකවරුන් පත් කිරිමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බැවින් එම ගුරුවරුන්ට සහාය ඉගැන්වීම් හෝ ගුරු උපදේශනය නොලැබේ. ඒ සඳහා පාසල් මට්ටමින් හෝ කලාප මට්ටමින් විෂය සම්බන්ධ විශ්වවිද්‍යාල ප්‍රවීණයින්ගේ මාර්ගෝපදේශන වැඩපිළිවෙළක් පාසල් මට්ටමෙන් ක්‍රියාත්මක කළ යුතු ය.
- නිර්ණායක පාදක ඇගයීම් ක්‍රමයක් යොදා ගනිමින් උසස් පෙළ ශිෂ්‍ය පැමිණීම, සාධන මට්ටම් යන දර්ශක ශිෂ්‍යයාගේ පාර්ශවයෙන් ද ප්‍රබෝධාත්මක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් මෙන්ම නියමිත විෂය අන්තර්ගතය ආවරණය යන දර්ශක ගුරුවරයාගේ පාර්ශවයෙන් ද

සැලකිල්ලට ගනිමින් ගුරු - සිසු දෙපාර්ශවයම ඇගයීමේ වැඩ පිළිවෙළක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම උචිත ය (අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය, 2019).

## 6.5 පාසල් මට්ටමේ කළමනාකරණය හා පරිපාලනය

- අන්ද්‍රාහැන්නදි සහ සෙසු අය, (2019) රේඛීය අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මගින් උසස් පෙළ පන්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ චක්‍රලේඛ සහ උපදෙස් පාසල තුළ ක්‍රියාත්මක වන පරිසරයක් සැකසීමට විදුහල්පති වගකිව යුතු ය. උසස් පෙළ එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති කාල පරිච්ඡේද ක්‍රියාත්මක කිරීම සම්බන්ධ නියාමනයක් තිබිය යුතු ය. සිසුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය සම්බන්ධ ව හඳුන්වා දී ඇති චක්‍රලේඛ හා උපදෙස් ක්‍රියාත්මක කිරීමට විදුහල්පති බලගැන්විය යුතු ය.
- අ. පො. ස. (උ. පෙ.) විෂයධාරාව තෝරා ගැනීමේ අවශ්‍යතාව සහ වැදගත්කම පිළිබඳ ව සිසුන් හා දෙමාපියන් පාසල් සංවර්ධන සමිති, පන්ති කව සහ පොදු රැස්වීම්වල දී දැනුම්වත් කිරීමේ වැඩසටහන් විශේෂඥ පුද්ගලයන් හෝ විශේෂඥ පුද්ගල කණ්ඩායම් මගින් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු ය. උසස් පෙළ විෂයධාරාව තෝරා ගැනීම පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පාසලේ ගුරුවරුන් මූලික වී සංවිධානය කිරීම උචිත ය. එහි දී ඊට අදාළ පහසුකම් විදුහල්පති විසින් සැපයිය යුතු ය.
- විභාගයට අයදුම් කිරීමෙන් පසුව සිසුන්ට පාසලේ නිශ්චිත පන්ති කාමරයක් නොවීම සම්බන්ධ අහිතකර පාසල් වාතාවරණය වෙනස් කළ යුතු ය. මෙම ගැටලුවට ජාතික මට්ටමේ මෙන් ම පාසල් මට්ටමින් ද වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

## 6.6 පාසල් උපදේශන සහ වෘත්තීය මාර්ගෝපදේශන සේවාව

- ශ්‍රී ලංකාවේ පාසල්වල 13 වන ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනය (2016) කරන ලද අධ්‍යයන නිර්දේශ අනුව පවත්නා විභාග ක්‍රමයේ තරගකාරී බව නිසා සිසුන් මෙන්ම දෙමාපියන් ද අසහනකාරී තත්ත්වයකට යොමු කර ඇති බැවින් ඒ සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන උපදේශන සේවාව පාසල් මට්ටමින්

ශක්තිමත් කිරීම අවශ්‍ය ය. සිසුන්ට විෂය සහ විෂයධාරා තෝරා ගැනීම, විෂය ඉගෙනුම හා සබැඳි ගැටලු විසඳා ගැනීම, විභාග භීතිකාව වැනි ගැටලු සම්බන්ධ අධ්‍යාපනික මාර්ගෝපදේශය මෙන් ම දෙමාපිය, දරු සබඳතා ඉගෙනුමට සහාය වීම සම්බන්ධ දෙමාපියන්ට මග පෙන්වීම ඇතුළත් පළපුරුදු, සුදුසුකම් ලත් උපදේශකවරුන්ගෙන් සමන්විත වූ උපදේශන සේවාව සක්‍රීය කිරීම අවශ්‍ය ය (ජාතික අධ්‍යාපන ආයතනය, 2016, Fan සහ Chen, 2001).

- පාසල්වල වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ශක්තිමත් කළ යුතුය. දැනට විධිමත්ව උපදේශනය ක්‍රියාත්මක නොවන පාසල්වල හැකි මට්ටමින් උපදේශන ඒකකයක් පිහිටුවා ගැනීම උචිතය. ඒ සඳහා ගුරුවරයකු පාසලින් නම් කර, ඊට අදාළ නිපුණතා ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් පාසල් මට්ටමින් සපයා දී උපදේශනය පිළිබඳ පාඨමා,ා හැදෑරීම සඳහා සුදුසු ආයතන වෙත යොමු කළ යුතුය. එහි දී වෘත්තීය මාර්ගෝපදේශයට අදාළ නිපුණතා ද උක්ත ගුරුවරයාට ලබා දෙමින් ඒ සමග වර්තමාන රැකියා පිළිබඳ අත්පත්‍රිකා (leaflets) සහ ඒවාට අදාළ පාඨමාලා හා ඒවා පැවැත්වෙන ආයතන පිළිබඳ විස්තර සිසුන්ට ලබා දිය යුතු ය. මේවා ගොනුවක් ලෙස පාසලේ උපදේශන හෝ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ ලැබීම උචිත ය. උපදේශන ඒකකයක් නොමැති පාසල්වල උක්ත ගොනුව පාසල් පුස්තකාලයේ ලැබිය හැකි ය.

## 7.0 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අධ්‍යාපන අමාත්‍යාංශය (2013). පාසල් පාදක ගුරු සංවර්ධනය, උපදෙස් සංග්‍රහය, බත්තරමුල්ල, අධ්‍යාපන අමාත්‍යාංශය.

අධ්‍යාපන අමාත්‍යාංශය (2016). අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය - චක්‍රලේඛ අංක 2016/13 , බත්තරමුල්ල, අධ්‍යාපන අමාත්‍යාංශය.

අන්ද්‍රාහැන්නදි, එච්. අයි. සහ සෙසු අය (2019). දකුණු පලාතේ පාසල්වල 13 වන ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් පැමිණීම අවමවීම පිළිබඳ සමීක්ෂණය, මාතර, රුහුණු විශ්වවිද්‍යාලය.

ඒකනායක, එස්. බි. සහ සෙසු අය (2012). *ශ්‍රී ලංකාවේ කුඩා පාසල් සඳහා සම්පත් කට්ටලයක්*, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, පර්යේෂණ, සැලසුම් සහ ගුරු අධ්‍යාපන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

උස්ගොඩ ආරච්චි, බී. (2020). අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය විෂයයෙහි සාධනය කෙරෙහි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය ප්‍රතිඵලයෙහි බලපෑම (අප්‍රකාශිත).

කොඩිතුවක්කු, ජී. (1992). ශ්‍රී ලංකාවේ රජයේ පාසල් හි 13 වන වසරේ සිංහල මාධ්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් මුදල් ගෙවා පෞද්ගලික පන්තිවල අධ්‍යාපනය ලැබීම සිසුන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් සහ අධ්‍යාපනඥයින් විසින් විධිමත් අධ්‍යාපනයට සාපේක්ෂව සංජානනය කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්, අධ්‍යාපන පර්යේෂණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

ගුණසේකර, පී. (2007). අ.පො.ස. (උ.පෙ.) සිසුන්ගේ පාසල් පැමිණීමේ රටා, ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ වාර සඟරාව, 10, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, මහරගම, ජාතික අධ්‍යාපන ආයතනය.

චන්ද්‍රලතා, කේ. ආර්. එන්. (2014) අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණීම වැඩි දියුණු කිරීම සඳහා වූ ක්‍රියාමූලික පර්යේෂණ, පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය (2014/2015), බත්තරමුල්ල, අධ්‍යාපන අමාත්‍යාංශය.

ජාතික අධ්‍යාපන ආයතනය (ජා.අ.ආ.) (2012). අ.පො.ස. (උසස් පෙළ) 12 සහ 13 ශ්‍රේණි රසායන විද්‍යාව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය (පසු විමසුම් කළ) විද්‍යා දෙපාර්තමේන්තුව විද්‍යා හා තාක්ෂණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය (ජා.අ.ආ.) (2016). ශ්‍රී ලංකාවේ පාසල්වල 13 ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් නොපැමිණීම, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, මහරගම ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය (ජා.අ.ආ.) (2018). යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා සබැදි මත විමසුම, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, මහරගම, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය (ජා.අ.ආ.) (2018). ශ්‍රී ලංකාවේ අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) පාඨමාලා හා සබැදි විෂයධාරා වරණය, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, මහරගම, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය (ජා.අ.ආ.) (2019) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සාර්ථක කර ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනයෙන් පර්යේෂණයක්, සන්දර්භ - අධ්‍යාපන පර්යේෂණ පුවත්, 2019, 2 (1), පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2012). පාසල් සිසුන්ගේ පෞද්ගලික උපකාරක පන්තිවලට සහභාගී වීම පිළිබඳ අධ්‍යයනය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2016). අධ්‍යාපනයේ ගුණාත්මකභාවය නගාසිටුවීම - ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

බ්‍රේ, මාර්ක් (1999). ඡායා අධ්‍යාපන පද්ධතියේ අභියෝගය ජයගැනීම - පෞද්ගලික උපදේශන සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිය කෙසේ සකස් විය යුතු ද ? IIEP ප්‍රතිපත්ති සංසදය, යුනෙස්කෝ ප්‍රකාශනයකි. පරිවර්තනය ඒ. ඇම්. බණ්ඩාරනායක අබේරත්න (2011).

විජේතුංග, එස්. සහ ධර්මවර්ධන, පී. (1995). දෙවැනි දශකය, කොළඹ 08, පූර්ණ අධ්‍යාපන සංවර්ධන පදනම

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (2010). අ.පො.ස. (උසස් පෙළ) විභාගය වර්ෂ 2011 සහ ඉන් පසුව පැවැත්වෙන විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න II වෙළුම. බත්තරමුල්ල: පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009). ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක්, සංදර්භය ගැටලු සහ යෝජනා, අවසන් වාර්තාව.

Abeywickrama, R. (2008). Research on attitudes of students to the GCE general English course with special emphasis on schools of the Balangoda educational zone, Sri Lanka Sabaramuwa University Journal, 8 (1); December 2008, pp 19-31.

Alawattegama, K. K. (2020). Free education policy and its emerging challenges in Sri Lanka, European journal of educational sciences, 7 (1); Retrieved from http://dx.doi.org/10.19044/ejes.v7no1a1.

Atukorala, K. (2019). The adverse effects on private supplementary tutoring, submitted to the Ministry of education under the research grant scheme of transformation education through evidence based Information.

Aturupane, H. et al. (2011). Strengthening science education in Sri Lanka, discussion paper series report No.45; South Asia human development sector, World Bank.

Damayanthi, B.W.R. (2018). The determinate of demand for private tutoring in Sri Lanka, International Journal of Education, Learning and Development, vol.6 No. 9 (pp 21-37) Retrieved from www.eajournals.org.uk.

Fan, X. & Chen M. (2001). Parental involvement and students' academic achievement: A meta-analysis; Educational psychology review13; Retrieved from www.springer.com.

Department of Examinations (2018). G.C.E (A.L.) examination performance of candidates - 2018, Research & development branch, National evaluation and testing service, Baththaramulla, Department of examinations.

De Silva A. (1994). Extra school tutoring in the Asian context with special reference to Sri Lanka, Colloquia on education. Lead Paper 10, Department of research, National Institute of Education, Maharagama.

Galdas P, Darwin, Z., Fell, J, et al. (2015). Health services and delivery, research, No. 3 (34), Southampton (UK): NIHR journals library; 2015 Aug. Retrieved from https://www.ncbi.nlm.nih.gov/books/NBK311090/.

Gobiga, K. (2017). The study on parents perception on emerging trend of private tuition classes towards their children's education in Kalawanchikudy D.S. devision in Batticaloa district, 7th international symposium, SEUSL (7-8 Dec,2017), Retrieved from www.uc.ic.

Hemachandra, H. L. (1982). The growing phenomena of tuition classes; the perceived reason and some latent social factions, Sri Lanka Journal of Social Sciences, 5 (2) p. 45.

Hewapathirana, T. K. & Withanage, C. A. P. (2005). The association among the factors that influence students in getting private tuition at the G.C.E. (A/L) examination, Retrieved from http://www.kin.ac.lk/uder/2005ARS.

Lin, T. C. (2010). Does a student's preference for a teacher's instructional style matter? An analysis of an economic approach, Economics Bulletin, 30(2), 1320-1332.

Manimarrphan, K. (2014). A Study on student attendance in Jaffna district schools, Education Perspectives 3(2); Research and development branch Ministry of Education.

Ministry of Education (2017). School census report, Statistics branch, Baththaramulla, Ministry of Education.

Ministry of higher education (2012). Sri Lanka qualification framework, Colombo, Ministry of higher education.

Ministry of education, cultural affairs, sports and youth affairs of Northern Province (2014). Northern education system review, Steering committee of the NESR, Ministry of Education Northern province, Jaffna

National Institute of Education (2015). An investigation into the nature of the school based assessment programme implemented in G.C.E. (O/L) classes (Interim Report), Department of Research and Development, National Institute of Education, Maharagama.

Nga, S. F., Zakariaa, R., Laia See, M. and Confessoreb, G. J. (2016). Study of time use and academic achievement among secondary school students in the state of Kelantan, Malaysia International Journal of adolescence and youth, 2016 21(4), 433–448, Retrieved from http://dx.doi.org/10.1080/02673843.2013.862733.

Pallegedara, A., and Yamano, T. (2011). Demand for private tuition classes under the free education policy, evidence from Sri Lanka, Proceeding of International Conference on Business Management, Vol.8 (2011) Retrieved from www.researchgatenet>publication.

Pararajasingham G. (1980). A study of the growth and development of private tuition in the city of Jaffna, A dissertation in partial fulfillment of the requirements for the degree of MPhil in education, University of Delhi.

Poisson, M. (2007). Private tutoring: asset or threat for mainstream education? Challenges and responses. Paper presented at the IIEP policy forum on confronting the shadow education system: what government policies for what private tutoring? Paris: IIEP-UNESCO.

Sawyer, F. (2018). Analyzing absenteeism in correlation to student achievement and behavior, International journal of contemporary research and review 09(11); Retrieved from www.ijcrr.info.

Seers, K. (2014). Qualitative systematic reviews: their importance for our understanding of research relevant to pain; British Journal of Pain 2015, 9 (1), 36–40, Retrieved from sagepub.co.uk/.

Shakira, M. N. F & Kengatharan, N. (2019). Every day students In schools matter reasons For not attending the school: Evidance advanced level

students, Department of human resource management, University of Jaffna.

Teasley, M. L. (2018). Absenteeism and truancy: Risk protection and best practice, Retrieved from www.researchgate,net.publication.

Zahrah, I. (2016). School dropouts: Implications for social advancement, Retrieved from http://dailynews.lk/.